- කාමය -

අති පූජ්‍ය මාන්කඩවල සුදස්සන හිමියන් විසින්

කරන ලද දේශනයකි

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

'කාමා භික්ඛවෙ වේදිතබ්බා
කාමානං නිදාන සම්භවො වේදිතබ්බො
කාමානං වේමත්තතා වේදිතබ්බා
කාමානං විපාකො වේදිතබ්බො
කාම නිරෝධො වේදිතබ්බො
කාම නිරෝධ ගාමිණී පටිපදා වේදිතබ්බො' ති

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, මේ පින්වත් සියළු දෙනා දැන් මේ සූදානම් වෙන්නෙ අද පුර පොහෝ දිනයෙ පෙහෙවස් සමාදන් වෙලා, ඒ ලොවුතුරා බුදු රජාණන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් දේශනා කළ සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවණය කරන්ට. හැම දෙනාම බොහෝම උවමනාවෙන්, ශ්‍රද්ධාව පෙරටු කරගෙන, මේ අවස්ථාවේ දී මේ ධර්මය ශ්‍රවණය කරන්නට ඕන. අපි ඊයේ සන්ධ්‍යා භාගයේදිත් කතා කළා යම් කිසි කෙනෙක් කාමයේ තණ්හාව නැතිකරලා මවු කුසකට නැවත නොපැමිණෙන්නේ නම් ඒ කොහොම ද කියන කාරණාව.

අද අපි ටිකක් කතා කරන්න හදන්නෙ, මේ දේශනාවෙන් පෙන්නන්නට බලාපොරොත්තු වෙන්නේ, අපි ජීවිතේ සාර වශයෙන් හිතාගෙන ඉන්න, මම කියලා මගේ කියලා හිතාගෙන ඉන්න මේ කාම වස්තූන්, කාමයන්ගෙ ස්වභාවය තේරුම් කරගන්ට පුළුවන් විදියෙ දේශනාවක්. මේ දේශනාව බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා අංගුත්තර නිකායෙ නිබ්බේධික පරියාය කියලා සූත්‍රයක් තියෙනවා. ඒ සූත්‍රයෙ කරුණු හයක් පෙන්නනවා. එයින් එක කරුණක් තමයි මේ කාමය සම්බන්ධව දහම් කරුණු විවරණය කරලා පෙන්වන පරියාය. ඒකෙදී බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා,

'කාමා භික්ඛවෙ වේදිතබ්බා
කාමානං නිදාන සම්භවො වේදිතබ්බො
කාමානං වේමත්තතා වේදිතබ්බා
කාම විපාකො වේදිතබ්බො

කාම නිරොධො වේදිතබ්බො
කාම නිරොධ ගාමිණී පටිපදා වේදිතබ්බො'

යම්කිසි කෙනෙක් කාමයන්ගෙන් මිදෙනවා නම්, කාමයන්ගෙන් වෙන් වෙන්න බලාපොරොත්තු වෙනවා නම්, එබඳු කෙනා මෙන්න මේ හය ආකාරය දත යුතුයි. මොකක්ද? 'කාමානං භික්ඛවෙ වේදිතබ්බා' කාමය කියන්නෙ මොකක් ද කියලා දත යුතුයි කියනවා. 'කාමානං නිදාන සම්භවො වේදිතබ්බො' කාමයන් ඇති වෙන්නෙ කොහොමද කියලා දැනගන්ට කියනවා. ඊට පස්සෙ 'කාමානං වේමත්තතා වේදිතබ්බො' කාමයන්ගේ නානත්වය වෙනස් බව මොකක් ද කියලත් දැනගන්න ඕන. 'කාමානං විපාකො වේදිතබ්බො' කාමයන්ගේ විපාකය මොකක්ද කියලත් දැනගන්නට ඕන. ඊට පස්සෙ කාම නිරෝධය මොකක් ද කියලත් දැනගන්නට ඕන. කාමය නිරුද්ධ කරන, නැති කරන ප්‍රතිපදාව මොකක් ද කියලත් දැනගන්ට ඕනෙ.

මෙන්න මේ ධර්මතා හය දැනගත්ත කෙනාට පුළුවන්, දැකගත්ත කෙනාට පුළුවන්, කාමයෙන් වෙන්වෙලා කාමය නිරුද්ධ කරලා, නැවත මවු කුසකට නොපැමිණෙන්නට.

ඉතින් පින්වතුනි, අපි පොඩ්ඩක් මේ ධර්මය සම්මර්ශනය කරන්නට පෙර ජීවිතාවර්ජනාවක් කරමු. පින්වතුනි, මේ ඉමක් කොණක් පරක් තෙරක් නැති අනවරාග්‍ර වූ සංසාරෙ ඉපදෙමින් මැරෙමින්, මැරෙමින් ඉපදෙමින් අපි හැම කෙනෙක් ම, මේ තෙරක් නොපෙනෙන ගමනක එනවා. ඒකට හේතුව බෙහෙවින් ම මේ කාමය කියන එක පිරිසිඳ නොදන්නා කම. කාම තණ්හාවෙන්, කාම ස්නේහයෙන් යුක්ත වෙච්ච නිසා නැවත නැවත මේ මවු කුසට පැමිණෙන්නෙ, අබුද්ධොත්පාද කාලවල වගේ අපි යම් යම් අවස්ථාවල ධ්‍යාන අභිඥා ලබාගෙන කාමයෙන් තාවකාලිකව මිදිලා ඕන තරම් ඉන්ට ඇති. නමුත් කාමය කියන ධර්මතාවය පිරිසිඳ නොදැක්ක නිසා, මනාව අවබෝධ නොකළ නිසා, සම්පූර්ණයෙන් ම කාමයෙන් මිදෙන්නට පුළුවන් කමක් අපිට ලැබුනෙ නෑ. ඉතින් මේ කාමයේ ස්වභාවය පිරිසිඳ දැකලා, කාමයෙන් මිදෙන්නට පුළුවන්කම ලැබෙන්නෙ බුද්ධෝත්පාද කාලෙක, අපිත් මනුෂ්‍ය ජීවිතයක් ලැබුවහම, ඒ කාමය පිරිසිඳ දකින සද්ධර්මයත් දේශනා කරලා තියෙන යුගයක. ඉතින් ඒ වටිනා අවස්ථාව අද අපිට ලැබිලා තියෙනවා. මේ කාමයන්ගෙ ස්වභාවය අවබෝධ කරගත්ත ලොවුතුරා

බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙච්ච යුගයක්, ඒ කාමයන්ගෙන් නික්මීම සඳහා දේශනා කළ ධර්මයත් පවතින යුගයක්. ඒ ධර්මය තේරුම් කරගෙන ජීවිතේට ළං කර ගන්න පුළුවන් විදියෙ ආත්ම භාවයකුත් අපිත් ලබාගෙන තියෙනවා. මේ වටිනා කාරණා ටික එක්රැස් වෙච්ච වෙලාවෙදි අපේ මේ ජීවිතේ තියෙන යම් යම් කාරණා දිහා නොබලා මේ ධර්මය අපේ සන්තානයෙ උපදවාගන්ට උත්සාහවත් වෙන්ට ඕනෙ. එහෙම ධර්මය අපේ සන්තානය තුල උපදවාගන්ට අපිට උපකාරයක් වෙන්නෙ ධර්මය පිලිබඳ ඇති අවබෝධය. ඒ නිසා සසර ගෙවාගන්න ඕනෙ කියන අදහසින් අපි හැම දෙනාම මේ දහම ටිකක් සම්මර්ශනය කරලා බලමු.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියලා. කාමය කියන්නෙ මොකක් ද කියලා දත යුතුයි කියලා බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා. එයින් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'පංච ඉමෙ භික්ඛවෙ කාම ගුණා' මහණෙනි, මේ කාමගුණ පහක් තියෙනවා. මොකක්ද? චක්ඛු විඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා, කාන්තා, මනාපා, පිය රූපා, කාමූපසංහිතා, රජනීයං, පළවෙනි කාරණාව තමයි. ඇසින් දත යුතු රූප තියෙනවා මොකක් ද? ඉෂ්ඨ වූ, කාන්ත වූ, මනාප වූ, ප්‍රිය ස්වභාවයෙන් යුක්ත වූ, කාමය ඇසුරු කළාවූ, කෙලෙසුන්ට හිත වූ රජනීය කෙලෙස් රජස් ඇතිවෙන්ට හිත වූ රූප තියෙනවා.

ඊට පස්සෙ සෝත විඤ්ඤෙය්‍යා ශබ්දා. කණින් දත යුතු ශබ්ද තියෙනවා. ඝාණ විඤ්ඤෙය්‍යා ගන්ධා, නාසයෙන් දත යුතු ගන්ධයෝ තියෙනවා. ජිව්හා විඤ්ඤෙය්‍යා රසා, දිවෙන් දත යුතු රස තියෙනවා. කාය විඤ්ඤෙය්‍යා පොට්ඨබ්බා. කයෙන් දත යුතු පොට්ඨබ්බයෝ තියෙනවා. මෙන්න මේ දේවල් වලට කියනවා මොකක් ද? කාම ගුණ කියලා. එතකොට මෙතෙන්දි මෙහෙම කාරණාවක් පෙන්නනවා. 'නේතෙ භික්ඛවෙ කාමා අපිච කාම ගුණා නා මෙතෙ අරියස්ස විනයෙ' බුදු රජාණන් වහන්සෙ දේශනා කරනවා, මහණෙනි, මේ කාමෙ නෙමෙයි. ආර්ය විනයෙ මේකට කාම ගුණයි කියලා කියනවා. මෙන්න මෙතෙන්දි හොඳ කාරණාවක් තේරුම් කරගන්නට ඕනෙ. ආර්ය විනයටයි මේවා කාම ගුණ වෙන්නෙ. අන්න ඒක හොඳට මතක තියා ගන්න ඕනෙ. මේ අපිට එහෙම කාම ගුණ නෙමෙයි. චක්ඛු විඤ්ඤෙය්‍යා රූප, සෝත,

විඤ්ඤෙය්‍ය ශබ්ද, ඝාණ විඤ්ඤෙය්‍ය ගන්ධ. ජිව්හා විඤ්ඤෙය්‍ය රස. කාය විඤ්ඤෙය්‍ය පොට්ඨබ්බය, කාම ගුණ කිවුවෙ කවුද? ආර්ය විනයේ ආර්ය ඥාණ දර්ශනයට අනුවයි. අපිට ඒවා මොනවද? කාමය, ඒ නිසයි මේ කියන්නෙ කාමයෙන් යුක්ත කෙනාටයි. කාමය දෙකට බෙදනවා. මොකක් ද? වස්තු කාම, ක්ලේශ කාම කියලා වස්තු කාම කියලා කියන්නෙ මොනවාද? දැන් මේ කතා කරන්නෙ අපේ මට්ටම. කාම භූමියෙ ඉන්න කෙනාගෙ මට්ටම. අපිට කාම වස්තූන් වෙන්නෙ මොනවාද? ඇහැට පෙනෙන රූප. කණට ඇහෙන ශබ්ද. නාසයට දැනෙන ගන්ධ. දිවට දැනෙන රස. කයට දැනෙන ස්පර්ශ. තව පැත්තකින් ගත්තහම ගෙවල් දොරවල්, ඉඩ කඩම්, හරකා බාන, වතුපිටි, යාන වාහන, මිල මුදල් කියන මෙන්න මේවට කියනවා මොනවාද? වස්තු කාම කියලා. ක්ලේශ කාම කියලා කියන්නෙ? ඒ ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, මිල මුදල් අරබයා, දුවා දරුවො අරබයා අපේ හිතේ යම් ඡන්ද රාගයක් ඇතිවෙනවා නම් යම් කැමැත්තක් ඇති වෙනවා නම්, තණ්හාවක් තියෙනවා නම් මෙන්න මේකට කියනවා මොකක් ද? ක්ලේශ කාමය කියලා.

අපි කියමු. ඇහැ කියන එක වස්තු කාමය. ඇහැ අරබයා ඇති කැමැත්ත ක්ලේශ කාමය. රූපය කියන එක වස්තු කාමය. ඒ අරබයා ඇති තණ්හාව, ක්ලේශය, ක්ලේශ කාමය, කණ, ශබ්දය කියන එක වස්තු කාමය. ඒ අරබයා ඇති ඇලීම නැත්නම් තණ්හාව කියන එක ක්ලේශ කාමය. එතකොට මෙන්න මේ විදියට වස්තු කාම ක්ලේශ කාම කියලා අපිට හම්බ වෙන මේ ධර්මතා ටික ගත්තහම, ක්ලේශ කාමය කියන එක පවතින්නෙ කුමක් ඇසුරු කරගෙන ද? වස්තු කාමය ඇසුරු කරගෙන. එතකොට යම්කිසි කෙනෙකුට වස්තු කාමයෙන් මිදිලා ඉන්න පුළුවන්. නමුත් ක්ලේශ කාමයෙන් මිදුනෙ නැත්නම් ඒත් කාමයෙන් මිදුනා කියන්නෙ නෑ. වස්තු කාමය තියෙන තැන අනිවාර්යයෙන් ම ක්ලේශ කාමය තියෙනවාමයි. මඩ සහිත තැනක මඩගඳ තියෙනවාමයි. මඩ තියෙද්දි මඩගඳ අයින් කරන්න පුළුවන් ද? බෑ. යම් තැනක මඩ නෑ. නමුත් මඩගඳ තියෙන්න පුළුවන් නේද? මඩ තිබුනත්, මඩ ගඳ තිබුණත් දෙකම කිලිටුමයි. මඩ වගේ දකින්න වස්තු කාමය. මඩ ගඳ වගේ දකින්න ක්ලේශ කාමය. එතකොට මඩ තියෙද්දි කවදාවත් මඩගඳ අයින් කරන්න පුළුවන් ද? බෑ. වස්තු කාමය ඇසුරු කරද්දි ක්ලේශ කාමය එතන ඉබේමයි තියෙන්නෙ. වස්තු කාමය ඇසුරු කරමින් ක්ලේශ කාමයෙන් මිදිලා ඉන්න ක්‍රමයක් නෑ. ඒ කාමනීය වූ වස්තූන් ඇසුරු කරන

බවම ක්ලේශය වෙනවා. නමුත් කෙනෙකුට වස්තු කාමෙන් මිදිලා ක්ලේශ කාමය තුල පවතින්ට පුළුවන්. යම් කිසි කෙනෙක් ගිහි ගෙවල්වල ආදීනව දැකලා, ආදීනව හිතලා සමහර විට පැවිදි ප්‍රවුර්ජා භූමියට පත්වෙලා හෝ යම් ව්‍රත සමාදානයකින් යුක්තව, ඉතා ප්‍රාන්ත කැලේකට ගිහිල්ලා වාසය කරනවා නම්, එයා ගෙවල් දොරවල්, යාන වාහන, මිල මුදල්, ඉඩ කඩම් කියන මේවයින් වෙන් වෙලා තියෙනවා. වස්තූන්ගෙන් වෙන්වෙලා තියෙනවා. නමුත් ඒවා අරබයා පවතින මනස දුරුවෙලා නැත්නම්, ඒවා පුන පුනා හිතෙන ගතිය තියෙනවා නම්, ඒවට තියෙන සෙනෙහස ඇලීම කියන එක හිතේ පවතිනවා නම් මෙයා වස්තු කාමයෙන් මිදුනට ක්ලේශ කාමයෙන් මිදිලා නෑ. මඩ නෑ. නමුත් මඩ ගඳ තියෙනවා වගේ.

එතකොට යම්කිසි තැනක පිරිසිදුයි කියලා කියන්නෙ, මඩත් නැතිවෙන්ට ඕන. මඩ ගඳත් නැතිවෙන්න ඕන. නේ ද? එතකොට අපිට වතුරක් වුනත් බොනවා නම් මඩ නෑ. නමුත් මඩ ගඳ, පල් ගඳ තියෙනවා නම් ඒ වතුර බොන්න පුළුවන් ද? අමාරුයි නේද? එතකොට මඩ ගඳත් නෑ. මඩත් නැතිනම් ඒ වතුර පිරිසිදුයි කියනවා අපි නේ. ඒ වගේ යම් සිතක් පිරිසිදුයි. ප්‍රභාශ්වරයි යන ගණයට යන්නෙ එයාගෙ හිතේ කාමය නමැති මඩත් නැතිනම්, ඒ මඩ ගඳත් නැතිනම්, කාමය අරබයා තියෙන ක්ලේශයත් නැත්නම් ඒ හිත තමයි ප්‍රභාශ්වරයි කියලා කියන්නේ. දැන් ඔය ප්‍රථම ධ්‍යානය වගේ ධ්‍යාන මට්ටම් ගත්තහම හැම වෙලේම කාමයන්ගෙන් මිදිලා. ඒකයි ප්‍රථම ධ්‍යානය වගේ තැනක් හඳුන්වන්නෙ 'විවිච්චේව කාමෙහි, විවිච්චේව අකුසලේහි ධම්මෙහි, සවිතක්කං, සවිචාරං, විවේකජං, ප්‍රීති සුඛං පඨමධ්‍යානං උපසම්පජ්ජ විහරති,' කියලා කියන කොට විවිච්චේව කාමෙහි, විවිච්චේව අකුසලේහි කියලා කියන කොට විවිච්චේව කාමෙහි කියලා කිවුවෙ කොතෙන්ට ද? අන්න මඩට. වස්තු කාමයට විවිච්චේව අකුසලේහි ධම්මෙහි කියලා කිවුවෙ මඩ ගඳට කෙලේසයට. වස්තු කාම ක්ලේශ කාම කියන දෙකෙන් මිදිලා තමයි ප්‍රථම ධ්‍යාන මට්ටම ලබන්න වෙන්නෙ. ඒ නිසයි, එතකොට අපි මෙතෙන්දි මේ කතා කළේ යම්කිසි කෙනෙකුට වස්තු කාමයෙන් මිදිලා ඉන්න පුළුවන්, නමුත් අපහසුයි බොහෝ දුරට ක්ලේශ කාමයෙන් මිදෙන්ට. ක්ලේශ කාමයෙනුත් තදංග වශයෙන් විෂ්කම්භන වශයෙන් මිදෙන්ටත් පුළුවන් කෙනෙකුට. නමුත් සමුච්ඡේද වශයෙන් මිදෙන්නට බෑ. තදංග වශයෙන් කියලා කියන්නෙ

අවස්ථාවකට. සමහරවිටක දැන් අපි බණ අහනකොට මේ අවස්ථාවේ දී ගෙවල්, දොරවල්, ඉඩකඩම්, දූ දරුවො ගැන අපි කයෙන් ඇසුරු කරන්නෙත් නෑ. හිතෙන් ඒවා ඇසුරු කරන්නෙත් නෑ. තාවකාලිකව මේ මොහොතට විතරක් මිදිලා. ඒකට කියනවා තදංග විමුක්තිය කියලා. ඒ අවස්ථාවට විතරක් අපි කාමයෙන් මිදිලා ඉන්නවා. නමුත් මේ බණ ටික ඉවර වෙන කොට ආපහු අපේ මනස පතිත වෙන්නෙ අර කාමනීය ධර්ම කෙරෙහිමයි. ඒ මඩ වල කෙරෙහිමයි. සමහර කෙනෙක් ලෞකික ධ්‍යාන ලබලා ප්‍රථම ධ්‍යානයෙ ඉඳලා, ඊට උඩ ධ්‍යාන ලබලා, විෂ්කම්භණ වශයෙන් කාලෙකට කෙලෙස් යටපත් කිරීම් වශයෙන් ධ්‍යාන උපදවාගෙන ඉන්නවා. වස්තු කාමයෙන් මිදිලා, ක්ලේශ කාමය යටපත් කරගෙන ඉන්නවා. ඒකෙ උපරිම ඉන්න පුළුවන් කොච්චර කල්ද? කල්ප අසූහාරදාහක් ඉන්න පුළුවන්. හැබැයි කල්ප අසූහාරදාහකින් පස්සෙ හරි ආපහු මතු වෙනවා. එතකොට ඒකට කියනවා විෂ්කම්භන ප්‍රහාණය කියලා. තදංග ප්‍රහාණය, විෂ්කම්භණ ප්‍රහාණය, සමුච්ඡේද ඒ කියන්නෙ ඉතිරි නොවන විදියට සිඳුනෙ නැති වුනොත් ආපහු ආපහු උපදිනවා. ආපහු ආපහු ඇතිවෙනවා.

බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නෙ යම් කිසි ගහක් කැපුවත් ගහේ මුල දැඩිව හොඳට තියෙනවා නම් ඒ ගහ නැවත දළු දානවා වගේ 'ඒවං තණ්හා අනුසයෙ අනුහතේ නිබ්බත්තතී දුක්ඛ මිදං පුනප්පුනං' මේ තණ්හා අනුසය නැති නොකළොත් මේ දුක නැවත නැවත උපදිනවා කියලා. ඒ විදියට දුක නැවත නැවත නූපදින්ට නම් ක්ලේශ කාම වස්තු කාම කියන දෙකම අපිට සමුච්ඡේද වශයෙන් නැතිවෙන්ට ඕනෙ. එතකොට අපිට පුළුවන් මේ වස්තුකාම ක්ලේශ කාම කියන දෙකෙන් මිදෙන්න නුවණින්. ඒකෙ ස්වභාවය තේරුම් කරගත්තහම. එතකොට අපි බලාගන්න ඕන ඉස්සරවෙලාම වස්තුකාම කිවුවෙ ගෙවල් දොරවල්, ඉඩකඩම්, මිල මුදල්, දූ දරුවො කියලා අපිට හම්බවෙන මේ දේවල් වස්තු කාම. තව පැත්තකින් ගත්තහම, නිෂ්පරියායකින් ගත්තහම ඇහැ, රූප, කණ, ශබ්ද, නාසය, ගන්ධ, දිව, රස, කය, කයට ගැටෙන පොට්ඨබ්බ කියන මෙන්න මේ දස ආයතනය රූප දහයම අපිට හම්බ වෙන්නෙ කොහොම ද වස්තු කාමය හැටියට. ඒ අරබයා ඇති ක්ලේශයට කියනවා මොකක් ද ක්ලේශ කාමය කියලා. එතකොට මේ වස්තු කාම, ක්ලේශ කාම කියන ධර්මතා දෙක අපිට කාමය වුනාට, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා,

'සංකප්ප රාගො පුරිසස්ස කාමො
නෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්ප රාගො පුරිසස්ස කාමො
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන්ති' කියලා

අපිට මේ කාමය කියන එක, අද කාමය වෙච්ච දේ. හොඳට බලන්න බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා 'සංකප්ප රාගො පුරිසස්ස කාමො - නෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ' මේ පුරුෂයාගේ සංකප්ප රාගො පුරිසස්ස කාමො - කාමය කියලා කියන්නෙ සංකප්ප රාගො සංකල්පනාවයි රාගයයි දෙකලු පුරුෂයාගේ කාමය. 'නෙතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ' මේ ලෝකයේ තියෙන චිත්‍ර කාමය නෙමෙයිලු. අපිට ඇහැට පෙනෙන, කණට ඇහෙන, නාසයට දැනෙන, දිවට දැනෙන, කයට දැනෙන අද අපිට කාමය වෙච්ච දේ ගැන බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේවා කාමය වුනේ පුරුෂයාගෙ කල්පනාව නිසයි. පුරුෂයාගෙ, ඒ ඒ පුද්ගලයාගෙ රාගය නිසයි මේවා එයාට කාමය වුනේ. නමුත් මේවා කාමය නෙමෙයි. මේවා ලෝකෙ හුදු චිත්‍ර විතරයි. ලෝකෙ පවතින යථා ස්වභාවය විතරයි. 'සංකප්ප රාගො පුරිසස්ස කාමො' ආපහු පෙන්නනවා. සංකල්පයයි රාගයයි දෙකයි පුරුෂයගෙ කාමය. 'තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ' මේ ලෝකෙ චිත්‍ර එහෙම තියෙනවා. ලෝකෙ චිත්‍රවල නෑ, අපි උපදවාගෙන ඇසුරු කරන කාමය කියලා එකක්.

'අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන්ති' නමුත් ධීරයන් වහන්සේලා පණ්ඩිතයන් වහන්සේලා මෙන්න මෙහි ඡන්දය දුරු කරනවා. අපි මෙන්න මේ ටික පොඩ්ඩක් බලමු. දැන් අපි දැක්කා. ක්ලේශ කාමය කියන එක අපිට ඇතිවුනේ වස්තු කාමය හම්බ වෙච්ච නිසානෙ නේද? ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, මිල මුදල්, දූ දරුවො කියලා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියලා කාමනීය වස්තු අපිට හම්බවුන කාම වස්තු තිබුන නිසයි තණ්හාව. ක්ලේශ කාමය පැවතුනේ. අපිට කාමය හැටියට හම්බවෙන තැනක බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'නේතෙ භික්ඛවෙ කාමා අරියස්ස විනයෙ කාමගුණා' මේවා ආර්ය විනයේ කාම ගුණයි කාමෙ නෙමෙයි කියලා. ඔන්න ඔය ටික හොඳට බලන්න ඕනෙ ආර්ය විනයටයි මේවා කාම ගුණ කියලා කිවුවෙ.

බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලාටයි මේවා කාම ගුණ හැටියට පෙනෙන්නෙ. අපිට ඒවා කාමය. දැන් මෙතන තියෙනවා ප්‍රශ්ණයක්. අපිට කාමෙ වෙන්ටත් බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලාට මේවා කාම ගුණ වෙන්ටත් හේතුව මොකක් ද?

මෙන්න මේ ස්වභාවය තේරුම් ගත්තහම, අපිට කාමය බුදු පසේ බුදු , මහ රහතන් වහන්සේලා කියනවා මේවා කාමගුණ, කාමය නෙමෙයි, කාමය ඇති කරගන්නට, හිතෙෂි දේවල්. ඊට පස්සෙ තව තැනකින් කියනවා පුරුෂයාගෙ සංකප්ප රාගය, සංකල්පනාවයි ඇලීමයි කාමය. මේවා නිකම් චිත්‍ර විතරයි කියලා. ඇහැට පේන දේ සම්පූර්ණ කාමය වුනොත් රහතන් වහන්සේලාට කාමයෙන් මිදිලා ඉන්න පුළුවන් වෙයි ද? බෑ. එහෙනම් රහතන් වහන්සේලාත් කාමය ඇසුරු කරනවා නම්, මේ ලෝකයාත් කාමය ඇසුරු කරනවා නම්, රහතන් වහන්සේලා කාමයෙන් මිදිලා නෙක්ඛම්ම සුඛයක් විඳිනවා කියලා කියන්න පුළුවන් ද? බෑ. එතකොට මෙතන තියෙන ධර්මතාවය අපි ටිකක් විමසලා බලන්නට ඕනෙ. එහෙනම් කොහොමද මේ කාමය අපිට හැදුනෙ, කියන එක. අපි කාමය කියන එක හදාගෙන, කාම ලෝකය කියන එක උපදවාගෙනයි. අපි පරිහරණය කරන්නෙ. නමුත් අපි ඒක දන්නෙ නෑ. අපි හිතන්නෙ අපිට තණ්හාව ඇතිවෙන්න තියෙන වස්තූන් තියෙන නිසයි අපි මේ කැමැත්තෙන් ඉන්නෙ කියලයි. යම් වෙලාවක අපි අපේ කෙලෙසය නිසයි දුක් විඳින්නෙ කියන එක අපිට තේරෙනවා මේ කාමය කියන එක හැදෙන හැටි, අපිට කාමය වෙච්ච හැටි ටිකක් තේරුම් කරගන්න පුළුවන් වුනොත්. එතකොට කාමය කියන තැන දී පින්වතුනි, බුදු රජාණන් වහන්සේ පෙන්නුවෙ මොකක් ද? මේ චිත්‍ර, චිත්‍ර කියලා කිවුවෙ ඇහැට පෙනෙන මට්ටම. කණට ඇහෙන මට්ටම. මේවා කාමගුණ කියලා. කොහොම ද කාම ගුණය කාමයක් වුනේ. සංකල්පයෙන්, රාගයෙන් කියනවා. ඇහැට පේන දේට අනුව අපි හිතනකොට අපි හිතන විදියේ දෙයක් තමයි අපිට දැනගන්න පුළුවන් වෙන්නෙ. අන්න එතකොට අපි හිතන්නේ ලෝකේ යථා ස්වභාවය දකින, දැකපු මනසකින් නෙමෙයි අපි හිතන්නේ අපේ මනස තුල කාම ලෝකය නිර්මාණය වෙන විදියටයි අපි හිතන්නෙ. කන බොන ආහාරයෙන් හැදුන, හම්, මස්, ලේ, නහරින් හැදුන රූපයක් තියෙන තැනක අපිට නිමිත්තක් පහළ වෙනවා හිතට. ඒකට අපි මනුෂ්‍යයෙක් කියලා හිතුවහම අපි දැනගන්නෙ කොහොම ද? මේ පේන රූපය මනුෂ්‍යයෙක් කියලයි

අපි දැනගන්නෙ. එතකොට දැන් මනුෂ්‍යයා උපදලා තියෙන්නෙ කන බොන ආහාරයෙන් ද අපේ මනසින් ද. අපේ මනසින් නේ ද? ඒ වගේ මේ සතර මහා ධාතුව තියෙන තැනක අපේ හිතේ පහළ වෙන නිමිති වලටයි අපි ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, මිල මුදල් කියලා හිතන්නෙ, එහෙම හිතුවහම අපිට, අපේ මනසට සම්පූර්ණ ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, මිල මුදල් වලින් යුක්ත වූ ලෝකයක් හම්බ වෙනවා. මේ කල්පනාව නිසා හෝ ඒ කියන්නෙ පෙනෙන දේට අනුව අපි කල්පනා කළොත් ඔන්න කාමය උපදිනවා. තව පැත්තකින් ගත්තහම ඒක තමයි සංකප්පය. රාගය කියලා කියන්නෙ පෙනෙන දේට කල්පනා කරන්න ඕන නෑ. පෙනෙන දේට අනුව හිත නැමිලා පවතින බවම, ඉදිරියෙන් තියෙන දේ මෙහෙම බලනවා කියන්නකො. මේ තමයි රාගය, පෙනෙන දේ ඇලිලා, ශබ්දයක් අහන බවම ශබ්ද රාගය, රූප බලන බවම රූප රාගය, ගඳ සුවඳ ආඝ්‍රාණය කරන බවම ගන්ධ රාගය, රස විඳින බවම රසය පිළිබඳ ඇති රාගය. කයට ස්පර්ශය අනුව හිත නැමී පවතින බවම පොට්ඨබ්බ රාගය, මෙන්න මේ කාමය නිර්මාණය වෙලා තියෙනවා. අපිට කාම වස්තු හැදිලා තියෙන්නෙ, අපි ඉස්සරහට තව ටිකක් බලමු. අපිට අද කාමය හැදිලා තියෙන්නෙ ඇහැට පෙනෙන, කණට ඇහෙන, නාසයට, දිවට, ශරීරයට දැනෙන ඒ අරමුණු අරබයා හිතන බව සහ ඊට නැමී පවතින මනස නිසයි. කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

අපි අද හිතාගෙන ඉන්නවා රූප, ශබ්ද, ගන්ධ, රස පොට්ඨබ්බ කාමය තමයි කියලා. බාහිරින් කාම වස්තු තියෙනවා කියලා. එහෙම තියෙන ඒවටයි අපි තණ්හා කරන්නෙ කියලා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඒවා ලෝකෙ චිත්‍ර මිසක කාමෙ නෙවෙයි. ඇහැට, කණට, නාසයට, දිවට, ශරීරයට, යම් අරමුණු ගැටෙන කොට, අරමුණු හම්බ වෙන කොට ඒ අරමුණු අරබයා අපේ මනසින් කරන කල්පනාව සහ අපේ මනස ඊට ඇලිලා පවතින ස්වභාවය මතයි කාමය කියන එක නිර්මාණය වෙන්නේ. කාමය කියන එක නිර්මාණය වෙලා තියෙන්නෙ කියලා බුදුරජාණන් වහන්සේ පෙන්වනවා. එතකොට ඔන්න කාමය කියන එක දකින්න ඕන වස්තු කාම ක්ලේශ කාම කියන ධර්මතා දෙකත්, වස්තු කාමය නිර්මාණය වෙච්ච නිසයි ක්ලේශ කාමය හැදුනෙ. ක්ලේශ කාමය හැදෙන්ට හේතු වෙච්ච වස්තු කාමය කියන එක හැදුනෙ කොහොමද සංකල්පයෙන්, අපේ රාගයෙන් කියන එකෙන්.

සංකල්පය රාගය කියන කොට අපි හිතන්නෙ ක්ලේශ කාමය කියලා. නෑ සංකප්ප, රාග කියන දෙකෙන් වස්තු කාමය හැදිලා වස්තු කාමයට ඇති කෙලෙස්සයයි අපිට ක්ලේශ කාම වෙන්නෙ. කාමය නැති තැනක කෙලේසය පවතින්න පුළුවන් ද? බෑ. ඉස්සෙල්ලා කාමය හදාගන්න වෙනවනේ. කාමය තිබුනොත්නෙ කාමය කියන්නෙ මොකක් ද? පෙනෙන්න තියෙන දෙවල්. කැමති වෙන්න දේවල් තියෙන්න එපායැ. කැමති වෙන දේවල් හදාගන්නත් අපිට සංකල්පනාවයි රාගයයි උපකාරී වෙනවා. අපි ඒක තව ටිකක් ඉදිරියට යන කොට වෙන්නෙ කොහොම ද වුනේ කොහොමද කියන එක බලමු.

මේ කාම සමුදය, කාම නිරෝධය කියන තැනින් අපිට හම්බවෙනවා කාමය හැදුනෙ කොහොමද කියන කාරණාව. එතකොට දැනට දකින්න ආර්ය විනයේ කාම ගුණයි කියන තැනක අපිට හම්බවෙනවා කාමය. මෙන්න මේක තමයි කාමය. කාමය කියන කොට ඕගොල්ලො දකින්න ඕන වස්තු කාම, ක්ලෙශ කාම කියන දෙක. ඒ වස්තු කාම ක්ලේශ කාම කියන දෙකෙන් දකින්න ඇහැ - රූප, කණ - ශබ්ද වගේ දෙවල් වස්තු කාමය. ඒ අරබයා ඇති තණ්හාව ස්නේහය ක්ලේශ කාමය, මෙන්න මේක තමයි 'කාමා හික්ඛවෙ වේදිතබ්බා' කියන කොට ඕගොල්ලො දකින්න ඕන. ඊට පස්සෙ ඒ විතරක් නෙමෙයි මේ කාමය ගැන තව මෙහෙමත් දකින්න ඕන. මට ටිකක් මතක මදි. නමුත් ක්‍රම කීපයක් තියෙනවා. ක්‍රම එකොළහක් බුදු රජාණන් වහන්සෙ දේශනා කරනවා මේ කාමය ගැන දකින්න කියලා. මේ වස්තු කාමය ක්ලේශ කාමය නිකම්ම එකක් නෙමෙයි මෙන්න මෙහෙම එකක් කියලත් දකින්න ඕන. කොහොමද?

අංගාරකාසුපමා කාමා - කාමය කියන්නෙ ගිනි අඟුරු වලක් වගෙයි. කියලා දකින්න කියනවා. බුදුරජාණන් වහන්සේ. ඇයි ඒ? සැප කැමති. දුක අකමැති, දුක පිළිකුල් කරන යම්කිසි පුරුෂයෙක් ඉන්නවා නම් ඒ පුරුෂයගෙ කැමැත්ත මොකක් ද? සැප කැමතියි. දුක අකමැතියි. දුක පිළිකුල් කරනවා. සැපයි ප්‍රාර්ථනා කරන්නෙ. මෙන්න මෙහෙම පුරුෂයෙක් ඉන්නවා විශාල ගිනි අඟුරු වලක් තියෙනවා ගිනිදැල් නෑ. නමුත් හාත්පස දිලිසෙන විශාල ගිනි අඟුරු වලක් තියෙනවා. බලවත් පුරුෂයො දෙන්නෙක් ඇවිල්ලා අර පුරුෂයගෙ අත් දෙකෙන් අල්ලගන්නවා බාහු දෙකෙන්. කොයි පුරුෂයගෙද? සැප කැමති,

ජීවත්වෙනු කැමති, දුක පිළිකුල් කරන පුරුෂයාගෙ. අත් දෙකෙන්ම අල්ලගෙන මේ ගිනි අඟුරුවලට ඇදගෙන එනවා. ගිනි අඟුරුවලට දාන්න ඇදගෙන එන මේ පුරුෂයාව අඩියක් අඩියක් ගානෙ ගිනි අඟුරු වලට කිට්ටු වෙනවා කියන්නෙ තමන්ගෙ බලාපොරොත්තුවම අත හැරෙනවා. මොකක්ද බලාපොරොත්තුව සැප කැමතියි. ජීවත් වෙන්න කැමතියි. දුක අකමැතියි. ලැබෙන්නෙම මොකක් ද මෙයාට. දුක ලැබෙනවා සැපම නැතිවෙනවා. ජීවත්වීමේ කැමැත්තම නොලැබෙනවා. එබඳු වූ පුරුෂයෙක් ගිනි අඟුරු වලකට දැම්මොත්, ගිනි අඟුරුවල නිසා හාත්පස දැවෙනවා නම් මරණය හෝ මරණය සමාන දුකට පත් වෙනවා නම් ඒ හේතුවෙන් මේ පුද්ගලයාගෙ ප්‍රාර්ථනාවම කැමැත්තම අතහැරෙනවා නම් මේ කාමය කියන එක එබඳු විදියකට දකින්න කියනවා.

ආර්ය විනයෙ කාම ගුණ වෙච්ච තැනක, අපි කාමය නිර්මාණය කරගෙන ඉන්නවා. අද අපි හිතාගෙන ඉන්නෙ මේ කාමය කියන එක ඒ කියන්නෙ ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම් කියලා මේ අපි සැප විඳිනවා. අපි මේ සතුටු වෙනවා. අපිට පිහිටක් පිළිසරණක් ඇතුව ඉන්නවා කියලා අපි හිතාගෙන ඉන්නෙ. ගෙවල් දොරවල්, යාන වාහන මේවා ගොඩක් අපි වටේ ළංකර ගත්තහම, අපිට සාමාන්‍යයෙන් කෙලෙසුන්ගෙන් ගැවසීගත් අපේ මනසට හිතෙන්නෙ අපි පිහිටක් ඇතුව ඉන්නවා. සරණක් ඇතුව ඉන්නවා දුකෙන් මිදෙන ක්‍රමේක ඉන්නවා කියලා. නෑ. අපි කවුරුවත් එහෙම වටකරගත්තා කියලාවත් වට කර නොගත්තත් කාමය තුළ ඉන්න කෙනා පිහිටක්, සරණක් ඇතුව ඉන්නවා එහෙම නෙවෙයි. ඒකට පෙන්නනවා අංගාරකාසුපමා කාමා. කාමය ගිනි අඟුරු වලක් වගෙයි. මේ ලෝකෙ සත්වයා සැප කැමතියි. ජීවත්වනු කැමතියි. දුක පිළිකුල් කරනවා. එබඳු ලෝකයාට දවසින් දවස සැප තමන් කෙරෙන් අයින් වෙනවා නම්, දුක තමන් කෙරේ ළං වෙනවා නම්, ජීවත් වීමේ බලාපොරොත්තුව මොහොතින් මොහොත අත අරවනවා නම්, ඒ ටික ඔක්කොම කරනවා කියනවා මේ කාමය. මේ කාමයෙන්, කාම රාගයෙන් මඩනාලද සිතින් යුක්ත කෙනා, මෙලොවම කාම රාගය නිසා නොයෙක් දුක් දොම්නස් වලට පත් වෙනවා. සංසාරික වශයෙන් ද සතර අපාය ආදී දුක්වලට පත්වෙන්න තියෙන අකුසල ධර්ම කෙරිලා, ඒ අකුසල ධර්මයන්ට පත්වෙනවා, පත් කරනවා සැප කැමති වුනාට දුකම ලබා දෙන ධර්මයක් නිසා කාමය දකින්න කියනවා මොකක්ද අංගාරකාසුපමා කාමා.

ඊට පස්සෙ අට්ඨිකඞ්ඛලූපමා කාමා. කාමය ඇටසැකිල්ලක් වගේ දකින්න කියනවා මොකක්ද? මස් නැති ලේ තැවරුන ඇට කෑල්ලක්, සතෙක් මරන තැනක ඇට කෑල්ලක් සුනඛයෙකුට වගේ විසි කළොත්, ඒ සතා මොකද කරන්නෙ ලේ තැවරුන මේ ඇට කෑල්ල ලෙවකනවා. ලෙව කෑවට බඩ එහෙම පිරෙන්නෙ නෑ. ඊට පස්සෙ මේ ඇට කූර හපනවා. හපනකොට, හපනකොට, හපනකොට මොකද වෙන්නෙ. තමන්ගෙ කට තුවාල වෙලා ඒ ඇට කෑල්ලෙ ලේ ගෑවෙනවා. තමන්ගෙ කට තුවාල වෙලා ලේ රහ දැනෙනවා. ඒ සතා හිතනවා කියන්නෙ මේ ඇට කූරෙ තියෙන රහ තමයි දැනෙන්නෙ කියලා තව හපනවලු. දැන් අලි කටු කන්නෙ. අලියා ඔය අන්දර කටු වගේ කටු ජාති කන්න හරි කැමතියි. හරි ආසයි. ඇයි ඒ? ඒ කටු කනකොට කටේ ඇනිලා ලේ එනවා. ලේ එනකොට ඒ ලේත් එක්ක තව හපනවා දැන් අලියා හිතන්නෙ මේ අන්දර කටු වලින් තමයි මේ රහ එන්නෙ කියලා. ඒ වගේ මේ ලෝකයා ද පෙන්නනවා මේ කාමය නිසා බඩපිරුන කෙනෙක් නෑ. කුස පිරුන කෙනෙක් නෑ. ඇති වෙච්ච කෙනෙක් නෑ. කාම සැපයෙන් සන්තර්පණය වෙච්ච පිරිච්ච කෙනෙක් ඉන්නවද බලන්න කවුරුවත් නෑ.

අලියා අර ලේ රහ දැනෙන්න දැනෙන්න තවත් හපනවා වගේ අපි හිතාගෙන ඉන්නවා දරු මල්ලො, ගෙවල් දොරවල්, මිල මුදල් ඔන්න මේවා එකතු කරනවා. එකතු කරන කොට මේවා එකතු කළානෙ කියලා මනෝ සම්ඵස්සයෙන් උපදින සැපයක් අපි විඳිනවා. ඒක මනෝ සම්ඵස්සයෙන් උපදින සැපේ. අපි හිතපු නිසා උපදින සැපයක්. අපි හිතනවා මේ වස්තූන් එකතු කරපු නිසා සැප එනවා කියලා. ආයෙත් එකතු කරනවා. ආයෙත් මට රත්තරං ගොඩක් තියෙනවනේ කියලා හිතනවා. හිතපු නිසා අපිට සෝමනස්සයක් එනවා. දැන් මේ හිතපු නිසා අපිට සැපයක් එන්නෙ. හිතන්නෙ මේ එකතු කරපු නිසයි මේ සැපය එන්නෙ. මට දරු මල්ලො, ගෙවල් දොරවල් තියෙනවනේ කියලා අපි හිතනවා. මනෝමයෙන් සිහි කරනවා. සිහි කරපු නිසා ඒ මනෝ ස්පර්ශය නිසා අපිට යම් සොම්නසක් එනවා. අපි හිතනවා මේවා එකතු කරපු නිසයි. ආයෙත් එකතු කරනවා. එහෙම කරන්නේ නැද්ද අපි? අර සතා ටිකක් හපනකොට කටේ ඇනෙනවා කටු. ලේ එනවා ඒ තමන්ගෙම ලේ රහ තමන්ට දැනෙනවා. හිතන්නෙ කොහොමද? එයාගෙ සංඥාව එන්නෙ කොහොමද? බාහිර කටු වලින් තමයි මේ රහ එන්නෙ. ඒ වගේ ගෙවල් දොරවල්, යාන වාහන ඉඩ කඩම්, මිල මුදල් එකතු කරනවා. මට

දැන් මෙහෙම දේවල් තියෙනවනෙ කියලා හිතින් සිහි කරනවා. හිතින් සිහි කරපු නිසා සෝමනස්සයක් එනවා. දැන් බැරිවෙලා හිතින් සිහි නොකළොත් ඕගොල්ලන්ට මේවා කොච්චර ගොඩ ගැහුවත් සැපක් එනවද? නෑ. හිතින් සිහි කරපු නිසා, චිත්ත ස්පර්ශය නිසා සැපක් එනවා. ආයෙත් හිතනවා මොකෙන්ද එන්නෙ. මේවා එකතු කරපු නිසා කියලා ආයෙත් එකතු කරනවා.

ඊට පස්සෙ බාහිර වස්තූන් කයට ගැටීම නිසා, කාය ස්පර්ශය නිසා සැපක් එනවා. ආපහු හිතනවා මොකක්ද? මේ සැපය එන්නෙ බාහිර වස්තු නිසා කියලා ආයෙත් ඒකට අතදානවා. අර මං කියන්නෙ ඉස්සරහ පිඟානක අපිට හොඳට ලස්සණට අයිසිං කරලා හොඳ කේක් කෑල්ලක් තියෙනවා. දැන් කෑල්ලක් කඩලා කනවා. කටේදි කෙළත් එක්ක මිශ්‍ර වෙලා වමනෙ ගොඩක් වෙලා හපනවා. හපනකොට වමනෙ ටික හැපීම නිසා සැපයක් එනවා. ආයෙ පෙන්නනවා මොකක්ද මේ කේක් කෑල්ල නිසයි සැපය. ආයෙත් අතදානවා. දැන් මේ සැපය ආවෙ කේක් කෑල්ල හින්දද? නෑ මොකක් හින්දද? වමනෙ ගොඩ නිසා. දැන් බැරිවෙලා ඕගොල්ලො හරි රහයි කියලා විඳින ඒ කටේ තියෙන ටික අතට ගන්නකො. අතට ගත්තොත් පිඟානෙ තියෙන ටිකවත් කයිද? කකා ඉන්න කෙනෙක් ඒ ළඟම ඉන්න කෙනෙක් කටේ තියෙන ටික බිමට දැම්මොත්, වමනෙ දැම්මොත් පලාතෙ ඉන්නවද? ඔන්න ඔහොම තැනකින් දැන් සැප විඳින්නෙ. අලියා කටු ඇනිලා දැන් ලේ රහ එන්නෙ උගේම ස්පර්ශයෙන්. නමුත් එයාගෙ සංඥාව යන්නෙ කොහේට ද? කටු ටිකට. ඒ වගේ දැන් කේක් කෑල්ල හපනකොට තමයි එන්නෙ මොකක්ද? රසය. නමුත් අපේ සංඥාව යන්නෙ මොකේටද? පිඟානෙ තියෙන එකට. දැන් කේක් කෑල්ලෙන් ද මේ රසය විඳින්නෙ. වමනෙ ටිකෙන්ද? වමනෙ ටිකෙන් රස විඳ විඳ කේක් කෑල්ල කියලා හිතනවා. අර අලියා කරපු දේම නෙමෙයිද කරන්නෙ. අර ඇට කූර ලෙවකාපු බල්ලා කරපු දේම නෙමෙයිද? කරන්නෙ. මුළු කාමයම ඔය වගේ නෙමෙයිද?

දැන් ප්‍රිය මනාප ලස්සන කෙනෙක් හෝ දෙයක් හෝ අල්ලනවා කියන්නකො. කාය ස්පර්ශය නිසා පොට්ඨබ්බය නිසා අපිට බාහිර අරමුණු කයට ගැටීම නිසා සැපක් විඳිනවා. අපි අරමුණු කරන්නේ මේ ඇහැට පේන දේ තමයි හැපෙන්නෙ කියලා. වෙන්නෙ වෙන එකක් හිතා ගන්නෙ වෙන එකක්. දැන් දිවට ගැටෙන්නෙ වෙන එකක්. පේන කේක්

කෑල්ල වෙන එකක්. නමුත් හිතාගන්නෙ වෙන එකක්නේ අපි. ඒ වගේ. ඔන්න ඔය වගේ අර්ථයෙන් මේ කාමය කියන එක කිසිම වෙලාවක කුසගින්න හැදුන සුනඛයෙක් ඇට කූරක් ලෙව කෑවා කියලා කවදාවත් බඩ පිරෙන්නෙ නෑ කියනවා ඒ වගේ කාම පිපාසයෙන් යුක්ත කෙනාට ඇති තරම් රූප පෙන්නන්න. පිරෙන දවසක් නෑ. ඇති තරම් සද්ද අහන්න. පිරෙන දවසක් නෑ. පුළුවන් තරම් ගඳ සුවඳ ආඝ්‍රාණය කරන්න. පිරෙන දවසක් නෑ. රස විඳින්න එක එක විදියට හිත කියන කියන විදියට රස කෑම හදලා කන්න ඇති දැන් නේ. ඇතිවෙලාද? මිහු. පිරුනෙ නෑ. කයට හිත කියන කියන විදියෙ කාය ස්පර්ශ දෙන්න. පිරුන දවසක් නෑ. පිරෙන දවසක් නෑ. එතකොට ඒ නිසා අට්ඨිකඞ්ඛලූපමා කාමා. කාමය කියන්නෙ කවදාවත්ම තෘප්තියකට පත්වෙන්න බැරි, පත්කරවන්නෙ නැති දෙයක්, ඒකම ඒකෙ ආදීනවයක් නෙවෙයිද? ඒකම ඒකෙ වෙහෙසක් නෙමෙයිද? පුරවන්න බැරි දෙයක් පුරවන්න කියලා හදන මේ ගතියම. කාමය කියන එක මෙන්න මෙබඳු ආදීනවයකින් යුක්තයි කියලත් දකින්න ඕගොල්ලො, වස්තු කාම, ක්ලේශ කාම කියලා නිකම් දකින්න එපා. අපි විඳින කාමය දකින්න. මොකක්ද? අට්ඨිකඞ්ඛලූපමා කාමා, කාමය කියන එක ඇටසැකිල්ලක් වගෙයි.

මාංසපෙසූපමා කාමා, කාමය කියන එක මස් වැදැල්ලක් වගෙයි කියනවා. මස් කුට්ටියක් අරගෙන මස් කපන තැනක මනුස්සයෙක් මස් ටිකක් කපලා පැත්තකින් තියලා යනකොට උකුස්සෙක් ඇවිල්ලා මස් කැටියක් ගහගෙන යනවා. දැන් මස් කැටිය කටේ තියෙන කොට මොකද කරන්නෙ අනික් උකුස්සො ඔක්කොම කොටනවා කියනවා ඒ උකුස්සට. මස් කැටිය තියෙන තාක්ම බේරෙන්න බෑ. බැරිවෙලා ඌ ඒක අතහරිනවා. එතකොට තව එකෙක් ගත්තොත්. ගත්ත එකාට කොටනවා. මේ කාමය කියන එක දකින්න කියනවා මාංසපේසි උපමාවෙන්. කාමය ගත්ත කෙනා හරියට, කාමය අල්ලාගත්ත කෙනා මොකද වෙන්නෙ අපි කියමු ඔන්න ඉඩකඩම්, ලොකු විශාල වත්තක් තියෙනවා. ඒක ගත්තා. දැන් ඒ වත්ත නිසා ඒකෙ හරියට වැඩ කරන්නෙ නෑ. හරියට එලදාවක් නෑ. නොයෙක් දේවල් ගැන දුක් දොම්නස් ඔන්න එයාව පන්නගෙන එනවා. ප්‍රිය විප්පයෝග දුක්ඛ, අප්‍රිය සම්පයෝග දුක්ඛ. නොයෙක් දේවල්. බැරිවෙලා අයියෝ මේක කරදරයි කියලා කාට හරි විකුණලා දැම්මොත්,දැන් එයා නිදහස් වෙනවා. අර දුක් ටික ඔක්කොම එයා පන්නාගෙන එනවා. ඒක කාට හරි විකුණලා දැම්මොත් දැන් ඒ දුක් ටික එයා මිදෙනවා. අනික් කෙනා අහුවෙනවා. ඒ

විතරක් නෙමෙයි ඒ වත්ත නිසා මෙලොව විතරක් නෙමෙයි පරලොව වශයෙන් ද වෙන අකුසල කම්. සේවකයො හරියට වැඩ කරන්නෙ නෑ. බනින්න වෙනවා. නින්දා කරන්න වෙනවා. අපහාස කරන්න වෙනවා. ඒකට හතුරුකම් කරන කෙනාට ලෝකෙ ඉතින් ඔක්කොම මෛත්‍රියෙන් ම කරන්න බෑනෙ. පුළුවන්, දහමක් තියෙන කෙනාට. නමුත් ලෝකෙ කාමෙන් පිරිච්ච කෙනා එහෙම කරන්නෙ නෑ. ඒකට එකට එක කරන්න හදනවා. ඔන්න සම්පරායික වශයෙන් අකුසල්, මෙලොව වශයෙන් උපක්‍රම කරන්න වෙනවා. ඉතින් ඒ මස් කෑල්ල අත නොහැර තිබුනොත් මොකද වෙන්නෙ. මෙලොව පරලොව වශයෙන් දුක් විඳින්න තියෙන හේතු ටික එයා අනුවම ලුහු බඳිනවා. බැරිවෙලා එයා ඒක අත හැරියොත් විකුණලා දැම්මා කියන්නකො වෙන කෙනෙක් ගත්තොත්. දැන් මොකද වෙන්නෙ. ගත්ත කෙනාට මෙලොව පරලොව වශයෙන් දෙකෙන්ම දුක් විඳින්න තියෙන හේතු ටික එයාව පන්නගෙන එනවා. ඒ වගේමයි අපි දූ දරුවො කියලා හිතාගෙන ඉන්න තැනත්, ගෙවල් දොරවල් කියලා හිතාගෙන ඉන්න එකත් මමයි කියලා හිතාගෙන ඉන්න තැනත්, මේ ඔක්කොගෙම එහෙමයි.

යම් යම් මට්ටම්වල මෙලොව පරලොව වශයෙන් දුක් විපාක තියෙනවා. ඒ දේ අතහැරියහම ඒක තව කෙනෙක් ගත්තොත්, එයාව පන්නගෙන එනවා ඒ දුක කියන එක. එතකොට මෙන්න මෙබඳු අර්ථයෙන් දකින්න කියනවා කාමය කියන එක. මොකක්ද? මොකක් වගේද? මස් වැදැල්ලක් වගේ. මාංසපේසී උපමා අර්ථයෙන් දකින්න කියනවා. ඊට පස්සෙ තිණුක්කූපමා කාමා. කාමය කියන්නෙ තණසුළක් වගෙයි කියනවා. රෑ කළුවරේ යම් කිසි කෙනෙකුට යන්න බැරිවුනහම එයා මොකද කරන්නෙ හුළු අත්තක් පත්තු කරගෙන යනවා. දැන් ඒක ඇවිලිලා, ඇවිලිලා, ඇවිලිලා එනවා. නමුත් කෙළවරට යනකම්ම අන්තිම මොහොතෙ හරි හුළුඅත්ත අත හැරියෙ නැත්නම් මොකද වෙන්නෙ. ඒකාන්තයෙන් පිච්චෙනවා. මේ කාමය කියන එක හුළු අත්තක් වගෙයි. ජීවිතේ අන්තිම මොහොතෙ හරි මේක අතහැරියෙ නැත්නම් පිච්චිලා මැරෙනවාමයි. ජරා මරණ දුකට පත්වෙනවාමයි කියනවා. හුළු අත්තෙ මුලින් හරි මැදින් හරි කෙළවරින් හරි ඒක ඇවිලෙන කාලෙදි අතහැරියොත් බේරෙන්න පුළුවන්. නමුත් ඒ හුළු අත්ත අත නොහැර හිටියොත් මොකද වෙන්නෙ. ඇවිලිච්ච හුළු අත්ත අත නොහැර හිටියොත් ඒකෙන් පිච්චිලා දුකට පත් වෙන්න වෙනවාමයි.

කාමය කියන එකත් පෙන්නුවා. කාමය මුලින් තරුණ කාලෙ හරි, මධ්‍යම කාලෙ හරි, අන්තිම කාලෙ හරි මේක අත නොහැරියොත් ඒකාන්තයෙන් ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන එකොළොස් ගින්නකින් දැවිලා, පිච්චෙන්න වෙනවාමයි.

ඊට පස්සෙ දකින්න කියනවා කාමය රුක්ඛඵලූපමා කාමා, කාමය කියන එක මොකක්ද ගෙඩි පිරුණු ගහක් වගේ දකින්න කියනවා. අඹ ගහක් හරි පේර ගහක් හරි ගෙඩි පිරුණ ගහකට මොකද වෙන්නෙ. ගෙඩි කඩන්න පොලු ගහනවා. ගල් ගහනවා. ගෙඩි නැති ගහකට වෙන්නෙ නෑ කිසිම හිරිහැරයක්. ඒ නොවෙන හිරිහැර ටික ඔක්කොම වෙනවා මොකේටද? ගෙඩි තියෙන ගස්වලට. එතකොට ගෙඩි නැති ගහකට පොලු පාරවල් ගල් පාරවල්, අතු කපනවා, ඉති කපනවා කියන එකක් වෙනවද? නෑ. ගෙඩි තියෙන ගහටමයි වෙන්නෙ.

ඒ වගේ කාමය ඇසුරු කරන කෙනාටම ජාති, ජරා, මරණ, ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාසයන් ලැබෙනවා කම් රැස්වෙනවා. ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක් දොම්නස් වලින් හිස් නෑ කියනවා හරියට රුක්ඛඵලූපමාවෙන් දකින්න කියනවා. මොකක් ද? කාමය කියන එක.

ඊට පස්සෙ පෙන්නනවා අසිසූනූපමා කාමා. කාමය කියන්නෙ දෙපැත්ත කැපෙන පිහියක් වගේ. සත්තිසූලූපමා කාමා. ඕකට පෙන්නනවා දැන් දෙපැත්ත කැපෙන පිහියක කිරි, මී පැණි වගේ දෙයක් ගාලා ලෙවකන්න කියනවා. කැපෙන පැත්තෙ දැන් ගාලා ලෙව කෑවහම, එතකොට මොකද වෙන්නෙ. මී පැණි චුට්ටක් ගෑවිච්ච නිසා චූටි රහක් දැනෙනවා. නමුත් ඒ එක්කම දිවේ පලාතක් කැපිලා යනවා. එතකොට ඇතිවෙන වේදනාව ආශ්වාදය ටිකයි. ආදීනවම ගොඩයි. මේ කාමය නිසා ලැබෙන ආශ්වාදයම ටිකයි. ආදීනවය මෙන්න මෙච්චරයි කියලා කියන්න බෑ. සසර තෙරක් නැති ජරා මරණ දුක ඔක්කොම ගැබ්වෙලා තියෙනවා   මේ කාමය කියන තැන. ඒ නිසා මේ කාමා භික්ඛවෙ වේදිතබ්බා කියන කොට නිකම්ම වස්තු කාමය ක්ලේශ කාමය දකින්න එපා. අපි බොහෝම ආදරෙන්, අපි බොහොම කැමැත්තෙන් අපි බොහොම මනාප කමින් ඇසුරු කරන කාමය කියලා කියන්නෙ මෙන්න මෙහෙම එකක් කියලා දකින්න. මොනවා හරි දෙයක් දැනගෙන එපායැ

අපි ඒකෙ ඇලුනත්, අපි ඇලෙන කාමෙ මෙහෙම එකක් කියලා දැනගෙන ඉන්න. මේ ටිකේ අපි ඇලෙනවා නම් මෙන්න මේ ටික අපිට දායාද වශයෙන් ලැබෙනවා. කියන එකත් තේරුම් ගන්න. කාමය කියන එකට තව තියෙනවා ගොඩාක් උපමා මට මතක නෑ.

ඇටසැකිල්ලක් වගෙයි, ඵල ඇති රුකක් වගෙයි, මස් වැදැල්ලක් වගෙයි, හුළු අත්තක් වගෙයි, ඇට කෑල්ලක් වගෙයි, ගිනි අඟුරුවලක් වගෙයි. දෙපැත්ත කැපෙන ආයුධයක් වගෙයි. කියලා මේ වගේ උපමාවලින් දකින්න මෙන්න මේකයි කාමය කියලා කියන්නෙ. කාමයෙන් යුක්ත කෙනා අර කියපු තැන්වල උපමා වලින් පෙන්නන ආදීනව පෙන්නන ගැහැටක් තියෙනවා නම් කාමය විඳින කෙනාට කාමය වළඳන කෙනාට මේ ඔක්කොම ටික විඳින්න වෙනවා වළඳන්න වෙනවා කියන එකත් මතක තියා ගන්න. එහෙම තියාගෙන ආයෙ කිසිම වෙලාවක ඒකෙන් බේරෙන්න පුළුවන්කමක් එහෙම නෑ. මෙන්න මේ විදියට දත යුතුයි. 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියන කොට කාමය දත යුතුයි. කියන කොට වස්තු කාමය කියන එක දකින්න ඇහැ රූප, කණ ශබ්ද, නාසය, ගන්ධ, කියන ඒවා. ක්ලේශ කාමය කියනකොට දකින්න ඒ අරබයා තියෙන ඡන්ද රාගය. මේකයි කාමය, ඒ කාමයේ ස්වභාවය තමයි මොකක්ද මෙන්න මෙබඳුයි මේ කාමය තණ සුළක් වගේ. ඇටසැකිල්ලක් වගේ කියලා මෙන්න මේ විස්තර ටිකත් දැනගන්න.

ඔන්න කාමා භික්ඛවෙ වේදිතබ්බා කියන කොට අපිට තේරෙන්න ඕන. තව විස්තර තියෙනවා. මම පොහොසත් නෑ ඒවා කියන්න. මෙන්න මෙ පමණින්වත් ටිකක් දැනගන්න ඕනෙ. අපි විඳින අපි හිතාගෙන ඉන්න අපි සැපයි කියලා හිතන කාමයේ ස්වභාවය ඔන්න ඕකටයි අපි කාමය කියලා කියන්නෙ. එතකොට මෙන්න මේ අපි කාමය කියන තැනට තමයි බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නෙ ආර්ය විනයෙ නම් ඕකට කාමය කියන්නෙ නෑ. ඔය කාමය සංකල්පයෙන්, රාගයෙන් හදාගෙන තියෙන්නෙ කියලා. අපි බලමු ඒකට ඒක කොහොමද කියන එක. ඊගාව කාරණාවෙන්. 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියලා ඔය ටික පෙන්නලා බුදුරජාණන් වහන්සේ පෙන්නනවා' කාමානං නිදාන සම්භවො වේදිතබ්බො' කාමයන්ගෙ ඇතිවීම දත යුතුයි. ඔන්න කාමය ඇතිවෙන හැටි පෙන්නනවා. කොහොමද කාමය ඇතිවෙන්නෙ. ඵස්ස සමුදයො - කාම සමුදයො ස්පර්ශය නිසා කාමය ඇතිවෙනවා. කොහොමද

ස්පර්ශය වෙන්නෙ. ඇහැ නොබිඳුනා. ඇහැත් හොඳට තියෙනවා ඇස් හමුවට රූපත් එනවා. ඊට අනුරූප වූ මෙනෙහි කිරීමක් නොවේ නම් ඊට අනුරූප වූ විඥාන භාගය පිහිටන්නෙ නෑ. එහෙම වුනොත් ස්පර්ශය නෑ. ඇහැත් හොඳට තියෙනවා. රූපයත් ඇස් හමුවට එනවා. ඊට අනුරූප වූ මෙනෙහි කිරීමකුත් වේ නම් ඔන්න ඊට අනුරූප වූ විඥාන භාගයාගේ පහළ වීම වෙනවා. ඒකට ස්පර්ශයයි කියනවා. ඔන්න හොඳට බලන්න මේ සිද්ධිය. ස්පර්ශය නිසයි කාමය ඇතිවෙන්නෙ. ස්පර්ශය කියන්නෙ කොහොමද? ඇහැට රූප ගැටුන පමණකින් ම හිත උපදින්නෙ නෑ. ඇහැත් තියෙනවා රූපයත් තියෙනවා ඒ රූපයට අනුව අපි හිතුවොත්, ඒ රූපයට අනුව හිත මෙහෙයෙවුවොත්, ඒ රූපයට අනුව නැමී පවතින මනසක් තිබුනොත් ඊට අනුව ඒ විඥානයාගේ පහළවීම වෙනවා. මොකක්ද? චක්ඛු විඥානය පහළ වෙනවා. තින්නං සංගති ඵස්සො. ඒ තුන්දෙනාගේ එකතුව ස්පර්ශයයි. ඔන්න කාමය උපදිනවා. ඔන්න වස්තු කාමය දැන් හැදිලා. අන්න ඒ වස්තු කාමය කියනකොට දකින්න මේ චක්ඛු සම්ඵස්ස අවස්ථාව දකින්න වස්තුකාමය, ඊට පස්සෙ චිත්ත වීථි අහලා තියෙනවානම්, ඒ සිතේ ම ජවන් මට්ටමට යනකොට දකින්න ක්ලේශ කාමය, අද අපිට වස්තු කාමය ක්ලේශ කාමයෙන් තොරව යමක් හම්බවෙන්නෙ නෑ. එතකොට ක්ලේශ කාමය තියෙන්නෙ වස්තු කාමය මුල් කරගෙන. හැබැයි වස්තු කාමය ද හදාගත්තෙ අපි. ඇයි ඒ ? ඇහැ තිබුනා. රූපය ඇස් හමුවට ආවා. ඊට අනුව අපි මෙනෙහි කළ නිසා නේද සංකප්පො කාමො. රාගො කාමො. ඒ පේන දේට අනුව නැමී පැවතුන නිසා නේද? අපිට ඊට අනුරූප වූ විඥානය පිහිටියේ. තේරුනා ද කියන එක. ඇහැත් තිබුනා. රූපයත් තිබුනා. ඊට අනුරූපව මෙනෙහි නොකළොත් ඕගොල්ලො වෙන්නෙ නෑ. එතකොට හොඳට බලන්න. කාමය කියන එක හදාගන්න හැටි. ඇහැ තියෙනවා. රූපය තියෙනවා. ඒ රූපයට අනුව මෙනෙහි කිරීමකුත් කරන්න ඕන. අපි ඒක දන්නෙ නෑ. හිත වේගවත් එච්චරට අපි වැරැද්ද පුරුදු කරලා. මෙහෙම බලනකොටම පේන දේට අනුව අපි හිතන නිසයි දැන් මේ හිතන බව ඉබේම වෙන තරමට ක්‍රියාත්මක නිසයි අපිට මේ ටක් ගාලා චක්ඛු විඥානය පිහිටන්නෙ. චක්ඛු විඥානය කියන්නෙ පේන දේට අනුව අපේ හිත පිහිටන විදියටයි. අපි හැසිරෙන්නෙ. ඔන්න ඔහොමයි කාමයෙ ඉපදීම.

එතකොට යම් වෙලාවක ඇහැ නොබිඳුනා ඇහැ හොඳට තියෙනවා. රූපය තියෙනවා. ඊට අනුව මෙනෙහි කළොත් ඔන්න විඥානය පිහිටනවා ස්පර්ශය. ඔන්න කාමය උපන්නා. කණ තියෙනවා. ශබ්දය තියෙනවා. ඊට අනුරූපව මෙනෙහි කරනවා. එතකොට මොකද වෙන්නෙ සෝත විඥානය උපදිනවා. තින්නං සංගති ඵස්සො. ඔන්න කාමය උපන්නා. නාසය තියෙනවා. ගන්ධය තියෙනවා. ඊට අනුරූපව මෙනෙහි කරනවා. එතකොට මොකද වෙන්නෙ ඝාණ ස්පර්ශය. ඔන්න කාමය උපන්නා. දිව තියෙනවා රස තියෙනවා ඊට අනුරූපව මෙනෙහි කරනවා. ඊට අනුරූපව මෙනෙහි කරනවා කියන ටික දකින්න සංකප්ප රාග කියන එක. රාග කියන කොට මෙතන චෛතසිකයක් වශයෙන් දකින්න එපා. ඒ අරමුණ අජ්ඣොසාය තිට්ඨති බැසගෙන පවතී නම්, නැමිලා පවතී නම්, නැඹුරු වෙලා පවතී නම්, අපි ඊට මෙනෙහි කරනවද කියන එකක්වත් දන්නෙ නෑ. මේ පේන දේ බලන ගතියම දකින්න රාගය. හැටියට පේන දෙයින් වෙන් නොවෙන ගතියම දකින්න. අජ්ඣොසාය තිට්ඨති. බැසගෙන පවතිනවා. කියන අර්ථය අපි දන්නෙ නෑ. ඒකත් මේ මට්ටමේ ඇලීමක් කියන එක. එතකොට මෙන්න මේ විදියට ඊට අනුරූපව මෙනෙහි කළොත් ඝාණ විඤ්ඤාණය පිහිටනවා. ඝාණ විඤ්ඤාණය උපන්නා කියන්නෙ ස්පර්ශයක්. දිව තියෙනවා. රස තියෙනවා. රසට අනුව හිතනවා. මෙනෙහි කරනවා. ජිව්හා විඤ්ඤාණය පිහිටනවා. ස්පර්ශයක්. කාමය උපන්නා. කය තියෙනවා. පොට්ටබ්බය තියෙනවා. පොට්ටබ්බයට අනුව හිතනවා. නැමී පවතිනවා. අජ්ඣොසාය තිට්ඨති. අන්න කාය විඤ්ඤාණය පිහිටනවා. එතකොට මොකද ස්පර්ශය. අන්න කාමය උපන්නා. ඔන්න කාමය හදාගෙන දැන් තියෙන්නෙ අපි. කාමය හදාගත්තා. වස්තු කාමය. ඒ අරබයා මනෝ විඤ්ඤාණ මට්ටමෙන් තමයි දුවා, පුතා කියලා තව ඒක වර්ණවත් කර ගන්නවා. හදාගත්ත කාමය. හදාගෙන ඔන්න අපි මොකද කරන්නෙ. එහෙම කරගෙන වස්තු කාම ක්ලේශ කාම දෙකම හදාගෙන දැන් මේ ජීවත් වෙනවා. එතකොට ඒ කාමය කියලා කිවුවෙ දකින්න මේ හදාගත්තෙ වස්තු කාමය නෙවෙයි මේ හදාගත්තෙ ක්ලේශ කාමය නෙවෙයි. මේ හදාගත්තෙ මේ පේන්නෙ දුවා නෙවෙයි. පුතා නෙවෙයි. ගෙවල් දොරවල්, යාන වාහන නෙවෙයි මොකක් ද? ඉස්සෙල්ලා කිවුව විස්තර ටික දකින්න. මේ හම්බවෙන්නෙ මේ හදාගත්තෙ මොකක්ද? මස් ලේ නැති ඇට සැකිල්ලක්. හදාගත්තෙ. ගිනි අඟුරු වලක් හදාගත්තෙ. බොහෝ කාලයක් තැවෙන්න හේතුවක් හදාගත්තෙ.

සැප කැමති අපට, සැප නොලැබෙන, දුක අකමැති අපට, දුක ලැබෙන යමක් හදාගත්තෙ. මේ හදාගත්තෙ කාමය එහෙම නෙමෙයි. කියන තැනින් දකින්න. මේ හදාගත්තෙ ජරා මරණ. මේ හදාගත්තෙ සසර. මේ හදාගත්තෙ සතර අපායට යන්න තියෙන භූමිය. කියන තැනින් දකින්න. ඔන්න 'කාමානං නිදාන සම්භවො වේදිතබ්බා' කියන කොට එයා දන්නවා ස්පර්ශය නිසා කාමය උපදින්නෙ. ස්පර්ශය කියන්නේ මෙහෙමයි.

ඇහැ තියෙනවා රූපය තියෙනවා තිබුනට ඒ ස්පර්ශය වෙනවද? නෑ. ඊට අනුව අපි මෙනෙහි කරන්නත් ඕන. අපිම මෙනෙහි කරන නිසා ඊට අනුව විඤ්ඤාණය පිහිටලා ඔන්න ස්පර්ශය වෙනවා. ඔන්න කාමය හදාගත්තා. එහෙම හදාගෙනයි මේ කාම තණ්හාව. ඒ කියන්නෙ දැන් අපි ගොවිතැන් කරන කොට අපිම බඩ ඉරිඟු හරි කව්පි හරි මොනව හරි හිටවනවා නේ. හිටවලා ඒක අපිම අනුභව කරනවා. හා හරි හොඳයි. කියලා අපිම ඇලෙනවා. ඒ වගේ අපිම නිෂ්පාදනය කරලා අපිම ඒක භුක්ති විඳිනවා නේ. ඒ වගේ කාමය කියන එක අපිම නිෂ්පාදනය කරලා අපිම භුක්ති විඳිනවා. එහෙම නැතුව මේ තියෙන ඒවා. අපිට ගිය ගමන් කඩාගෙන කන්න හැම තැනම බඩ ඉරිඟු, කව්පි මුං ඇට එහෙම නෑ. ඒ වගේ මේ කාම භාණ්ඩ හැම තැනම අපිට ඕන ඕන විදියට අරගෙන කන්න බොන්න නෑ. තියෙන්නෙ සතර මහා ධාතුව. ඒක හදාගෙනයි අපි මේ විඳින්නෙ.

එතකොට ඔන්න කාමානං නිදාන සම්භවො වේදිතබ්බො කියන කොට කාමයන්ගේ ඇතිවීම දකිනවා කොහොමද ඇතිවීම. ස්පර්ශය නිසයි කියලා. ඊට පස්සෙ කාමානං වේමත්තතා වේදිතබ්බො කාමයන්ගෙ නානත්වයකුත් තියෙනවා. මොකක් ද කාමයන්ගෙ නානත්වය. අඤ්ඤෙදසු රූප කාමා. අඤ්ඤෙදසු ශබ්ද කාමා, අඤ්ඤෙදසු ගන්ධ කාමා. රූපයන්ගෙන් පෙනී හිටින කාමෙ නෙමෙයි ශබ්දයන්ගෙ. ශබ්දයන්ගෙන් පෙනී හිටින කාමෙ නෙමෙයි ගන්ධයන්ගෙ. ගන්ධයන්ගෙන් පෙනී හිටින කාමෙ නෙවෙයි රසයන්ගෙ. රසයන්ගෙන් පෙනී සිටින කාමෙ නෙමෙයි ස්පර්ශයන්ගෙ. මෙන්න මේ රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ කියන ඒ අරමුණු වල නානාත්වයෙන් කාම නානත්වය දකින්න. 'කාමානං විපාකො වේදිතබ්බො' කාමයන්ගේ විපාකය දත යුතුයි. මොකක් ද කාමයන්ගෙ විපාකය.

'යං බො භික්ඛවෙ කාමයමානො තජ්ජං තජ්ජං අත්තභාවං
අභිනිබ්බත්තෙති පුඤ්ඤභාගියං වා අපුඤ්ඤභාගියං වා'

යං කාමයමානො - යමකට කැමතිවෙයි නම්, යමකට කැමති වෙනකොට එයින් එයින් උපදනා ආත්මභාවය උපදිනවා කුසල අකුසල සහගත වූ. ඒ කියන්නේ අපි පෙනෙන දේට කැමති වුනොත් ඔන්න එයින් උපන් ආත්මභාවය කියන්නෙ සම්පරායිකා දිට්ඨධම්මා එයින් උපදනා ආත්ම භාවය කියලා කිවුවෙ සත්ව පුද්ගල ආත්ම හැඟීම උපදිනවා. යමකට කැමතිවෙන්න කැමතිවෙන්න පුද්ගලයා නිර්මාණය වෙන්නෙ මෙහේ. දැන් අපිට හැමෝටම මේ මම කියලා හිතන්න පුළුවන් නේද? මේ තමන් ඉන්නවා කියන ගතිය තේරෙනවා නේද? මේ කෙනෙක් කියන ගතිය තේරෙනවා නේද? මේ මම හින්දා හිතන්නේ මේ කය මම කියලනේ. මේ කය මම හින්දා මම නෙමෙයි මේ. මම කියන හැඟීම අපේ හිතේ තියෙන්නෙ හිත රැඳිලා පවතින්නේ කයේ. ඒ නිසා මේ කය මම වගේ තේරෙන්නෙ. නමුත් අපි හිතාගෙන ඉන්නෙ කය මම හින්දා මේ මම කියලා. මේ මගේ අත. මේ මගේ ඇඟ. කියලා අපි හිතන්නෙ. නමුත් සිද්ධිය එහෙම නෙමෙයි. මම කියන හැඟීම. අපිට අපිව හීනෙන් පේනවනේ. පේන්නෙ නැද්ද තමන්ට තමන්ව හීනෙන් පෙනිලා තියෙනවද? ඉතින් මේ කය නම් තමන් කොහොමද හීනෙන් පෙනුනෙ.

දැන් ඔය තමන් කියන හැඟීම ඇතිවෙන්න ඔය හැඩේම පත්තරේක තිබුනොත් ඇතිවෙන්නෙ නැද්ද? තේරෙනවද ඒක දකිනකොට මනස තුලයි ඇතිවෙලා තියෙන්නෙ කියලා. මේ තමන් කියන හැඟීම චිත්‍රයක තිබුනොත්, බිත්තියක එහෙම ඇඳලා මේ මමනෙ කියන හැඟීම ඇතිවෙනව ද නැද්ද? ඒ හැඟීම ඇතිවෙන්න හේතුව ඒ චිත්‍රය ද? පාට ටික ද මම. එහෙනම් හොඳට තේරෙනවද ඒක උදවු කරගෙන ටක් ගාලා ක්ෂණිකව මනස සිහි කරගෙන කියලා. ඒ වගේ මේ රූපයත් දකින කොට මම කියන හැඟීම මේ ඇතිවෙලා තියෙන්නෙ. මේ බාහිර චිත්‍රය දැක්කා වගේ. වීඩියෝ පටයක් දැක්කා වගේ. වතුරක මේ ඡායාව දැක්කත් මම එනවනේ නේ. ඒ වගේ මේ රූපය දැක්කහම මම කියන හැගිම එනවා. ඒ මම කියන හැගීම තියෙන්නේ කොහෙද? හිතේ හැපිලා. හිතේ පවතින්නෙ මේ මානය මම වෙමි අස්මිමානය. මම වෙමි කියන හැඟීම. මම වෙමි කියන හැඟීම කියනකොට මේ පේන සටහනම හිතට නිමිත්ත අරගෙන තියෙන්නෙ මනෝමය කයකින්. මම කියන හැඟීමෙන් ඉන්නෙ අපි මේ මම කියලා හිතාගෙන. අන්න ඒ මම

කියන වචනෙ නෙමෙයි හැඟීමම. මම කිවවුහම අපිට හිතෙන්නෙ කෙනාව කියලා කොතන හරි දැක්කම මේ මගේ රූපෙනෙ කියලා හිතෙන ගතිය තියෙන්නෙ ඒ ටිකම. ඒ ටික ඔක්කොම තියෙන්නෙ හිතේ. ඒ සිත බැසගෙන තියෙන්නෙ මේ කයේ. ඒ හින්දා දැන් කය මගේ වගෙයි අපිට තේරෙන්නෙ. දැන් මෙතන දී මේ හිතේ තියෙන මම කියන ගතිය පවතින්න, පවතින්න මේ කය පේන්නෙ මම වගේමයි. යම් වෙලාවක මේ හිතේ තියෙන මම කියන ගතිය අස්මි මානය මම කියන හැඟීම ගෙවුනොත් ටික ටික ඉබේම පෙනෙයි මේක නිකම්ම නිකම් රූප මාත්‍රයක් විතරයි කියලා. දැන් ප්‍රශ්නයක් තියෙනවා. 'තජ්ජං තජ්ජං අත්තභාවං' - මෙහෙ යමකට කැමති වෙන්න කැමති වෙන්න මේ පුද්ගලයයි හැදෙන්නෙ මෙහේ. ඕකට හොඳ කතාවක් තියෙනවා.

මේ උත්පත්ති හරි පුදුම උත්පත්ති තියෙන්නෙ. ඔය සමහර ආත්මභාව තියෙනවා රළු, නරක, සැඩ, පරුෂ, වචනයන්ට හරි කැමතියි. දැන් ඕගොල්ලො කවුරුවත් කැමති ද බනිනවට. නෑ. සමහර ආත්මභාව තියෙනවා එයාගෙ පැවැත්ම වෙන්නෙ මොකක්ද? තරහව ඇතිවෙන විදියෙ වචන ඇහෙනවා නම් ඒක තමයි එයාගෙ ජීවිතේ. එයිට වඩා දෙයක් නෑ. ඕකට කියනවා ක්‍රෝධ භක්ෂ සත්වයෝ කියලා. ක්‍රෝධය භක්ෂණය කරනවා. ක්‍රෝධය ආහාර වශයෙන් ගන්න සත්වයෝ. එක්තරා දවසක් තව්තිසා දිව්‍ය ලෝකෙදි මේ ක්‍රෝධ භක්ෂ යක්ෂයෙක් ගිහිල්ලා ශක්‍රයගෙ පාණ්ඩු කම්බල ශෛලාසනේ ඉඳගන්නවා. පඬුපුල් ආසනේ ඉඳගෙන දැන් ඉන්නවා. ශක්‍රයා ඇවිල්ලා ඉඳගන්න බලනකොට මේ යකෙක් ඉඳගෙන. බනින්න ගත්තා . ''නීචයා, දුෂ්ඨයා, උඹ පලයන් ඔතනින්. උඹට අයිති නෑ ඕක මගේ'' කියලා බණින්න බණින්න මේ යක්ෂයා ලස්සණ වෙලා, වර්ණවත් වෙලා බබල බබල ඉන්නවා හොඳට. දැන් ආසනෙන් එකයි එන්න එන්න. බණින්න බණින්න ලස්සණයි බණින්න බණින්න ලස්සණයි. මොකද එයාගෙ ආහාරය ක්‍රෝධය. දැන් එයාට ආහාර. ක්‍රෝධය නැති වෙලාවට ආහාර නැ. ශරීරයට ආහාර නෑ. ඉතින් මේ ක්‍රෝධ භක්ෂ යක්ෂයා මොකද කරන්නෙ ක්‍රෝධය ලැබෙන්න ලැබෙන්න ලස්සන වෙලා වර්ණවත් වෙලා එනවා හොඳට. දැන් ඉතින් තවත් බලවත්. ශක්‍රයා දැනගත්තා මේ ක්‍රෝධ භක්ෂ ආහාරය. මෙයාට නම් මෙහෙම හරියන්නෙ නෑ. අනික් අතට කිවුවා. ''අනේ ඔයා හරිම හොඳයි. බොහෝම වටිනවා ඔහොමම ඉන්න'' කියලා ගුණ කියන්න ගත්තහම එන්න එන්න ටික ටික දුර්වර්ණ

වෙලා මිරිකිලා පැනලම දිවුවා. ඒ වගේ ක්‍රෝධ භක්ෂ යක්ෂයා වර්ණවත් වෙන්නෙ, හොඳට බබලන්නෙ, හොඳට සප්‍රාණිකව ඉන්නෙ එයාට ආහාර වෙච්ච වචන ඇහෙනකොටනෙ. ඒ වගේ මේ කාමයන්ගෙ තියෙන විපාකෙ තමයි මෙහෙ බලාගෙන යමක් කැමති වෙනකොට අර, ක්‍රෝධ භක්ෂ සත්වයා වගේ මෙහෙ හොඳට මම කියන හැඟීම පුෂ්ඨිමත් වෙලා, ලස්සන වෙලා , හැඩ වැඩ දාලා මේ මම හොඳට පය ගහලා ඉන්නවා. සද්දෙට මෙහෙ කැමති වෙනකොට මෙහෙ මාව තමයි හැදෙන්නෙ. මෙහෙ ගන්ධෙට කැමති වෙනකොට මෙහෙ මාව තමයි හැදෙන්නෙ. මම හොඳට නිරුපද්‍රිතව තමන්ට තමන් ඉන්නවා කියලා හිතන්න. මම ඉන්නවා කියලා හිතන විදියට මේ මාව ඉන්නෙ, කුමක් නිසා ද මෙහෙට කැමති වෙන නිසා. ඕගොල්ලො බැරි වෙලා 'යං කාමය මානො තජ්ජං තජ්ජං අත්තභාවං අභිනිබ්බන්ති' යමක් කැමති වෙයි නම් එයින් එයින් උපදනා වූ ආත්මභාවය දත යුතුයි. මෙහෙ මම කියලා කෙනෙක් ඉන්නවා කියලා අපිට හිතෙන විදියට මේ පුද්ගලයා හොඳට අලුත් වෙලා, ලස්සන වෙලා, හොඳට හැදිලා අපිට මේ මාව සිහි කරගන්න පුළුවන් විදියට මගේ ඇහැ, මගේ කණ, මගේ දුව, මගේ පුතා කියලා හිතන්න පුළුවන් විදියෙ මම හැදෙන්නෙ කොහොමද, එයා පවතිනේ කොහොමද මේ කාමයෙ විපාකෙ තමයි මාව හදන එක. ආත්ම භාවය හදන එක. තමන් ජීවත් වෙන්නෙ, තමන් හැදෙන්නෙ මේ කාමය නිසයි. බැරිවෙලා අර ක්‍රෝධ භක්ෂ යක්ෂයට ගුණ කියන්න එහෙම ගත්තොත්, බැරිවෙලා මෙහෙට කැමති වෙන්නෙ නැතුව ඕක අනික් පැත්තට එහෙම හිතන්න ගත්තොත් මෙයාට තමයි ඉන්න බැරි වෙන්නේ. මෙයා එන්න එන්න පොඩි වෙලා හීන් වෙලා දුර්වර්ණ වෙලා නැති වෙලා යනවා. දැන් රහත් වෙනකොට කියන්නෙ මානය නැතිවෙනවා අස්මි මානය නැතිවෙනවා කියලා ඒ වගේ.

දැන් මෙහේ කාමය ඇසුරු කරනතාක් ඒකෙ විපාකෙ කියන්නෙ මොකක් ද හොඳට පුද්ගලයයි ඉන්නෙ. ඉතින් හොඳට දැනගන්න ඕනෙ මේ කය මම වගේ පෙනෙන්නෙ කය මම හින්දා නම් නෙමෙයි. කය මම කියලා පේන්නෙ මොකක් හින්දද? මම කියන හැඟීම. මෙහේට කැමති වෙච්ච නිසා හිතේ මම කියන හැඟීම හොඳට පෝෂණය වෙලා තියෙනවා ඒ හිත බැසගෙන තියෙන්නෙ කයේ ඒ නිසා කය මම වගේ. ඔන්න ඕක තමයි කාමයෙ විපාකය. කාමය ඇසුරු කළොත් කැමති වුනොත් හැදෙන්නෙ කවුද? මම. එතකොට මෙහේ මම හැදුනොත්

මොකද වෙන්නෙ. තජ්ජං තජ්ජං අත්තභාවං ඒ ඒ කරුණින් ආත්ම භාවය උපදිනවා. ඒ ආත්ම භාවය කුසල හෝ අකුසල සහගතයි. ඒ තමයි සම්පරායික වශයෙන් මරණින් පස්සෙ කුසල කරගත්ත මම. අකුසල කරගත්ත මම. නැත්නම් පුද්ගලයට අනුව යන්න පුළුවන් එහා පැත්තට.

දැන් කීයක් කිවවුද? කාමය කිවුවා. කාමයන්ගේ ඇතිවීම කිවුවා. කාමයන්ගෙ වෙනස් බව කිවුවා. කාමයන්ගෙ විපාක කිවුවා. දැන් කියන්න තියෙන්නෙ මොකක් ද 'කාම නිරෝධෝ වේදිතබ්බො' කාම නිරුද්ධ කරන්න ඕන. කොහොමද කාම නිරෝධ වෙන්නෙ. ස්පර්ශ නිරෝධයෙන් කාම නිරෝධයි. ස්පර්ශය නිරුද්ධ වෙන විදියට දැන් කටයුතු කරන්න ඕන. කොහොමද ස්පර්ශය නිරුද්ධ වෙන්නෙ. රූපාරම්මණය. ඇහැ නොබිඳුනා. ඇහැ තියෙනවා. බාහිර රූපයත් ඇස් හමුවට එනවා. ඕගොල්ලො ඊට අනුරූපව මෙනෙහි නොකළොත්. ඊට අනුරූපව කිවුවෙ කුමකට අනුරූපව ද? පේන රූපයට අනුව මෙනෙහි නොකළොත්. පෙනෙන රූපයට අනුව මෙනෙහි නොකළොත් මොකද වෙන්නෙ. චක්ඛු විඥානයාගේ පහළවීමක් නෑ. පිහිටුවීමක් නෑ. එතකොට ස්පර්ශය යන පැනවීමක් පනවන්නෙ නෑ. කණත් තියෙනවා. ශබ්දයත් තමන් හමුවට එනවා. ඊට අනුරූපව මෙනෙහි කරන්නෙ නෑ. ඊට අනුරූපව කිවුවෙ මොකේටද? ශබ්දයට අනුව තමන් හිත මෙහෙය වන්නෙ නෑ. එහෙම වුනොත් සෝත විඥානයයි යන විඥානය උපදින්නෙ නෑ. එහෙම වුනොත් ස්පර්ශය යන මේ පැනවීම නෑ. ස්පර්ශය නෑ කියලා කියන්නෙ මොකක්ද? කාමය යන පැනවීම නෑ. කාමය නිරුද්ධයි.

නාසයත් නොබිඳුනා, ගන්ධයත් එනවා. ඊට අනුරූපව මෙනෙහි කරන්නෙ නෑ. එහෙම වුනොත් විඥානය පිහිටන්නෙ නෑ. ස්පර්ශය නෑ.

දිවත් තියෙනවා. රසත් දිව හමුවට එනවා. ඊට අනුරූපව මෙනෙහි කරන්නෙ නෑ. එතකොට මොකද වෙන්නෙ විඥානය පහළ වෙන්නෙ නෑ. එතකොට කියනවා ජිව්හා ස්පර්ශය නෑ. ස්පර්ශය යන පැනවීම නෑ. කය තියෙනවා පොට්ඨබ්බයත් කය හමුවට එනවා. ඊට අනුරූපව මෙනෙහි කරන්නෙ නෑ. එතකොට මොකද වෙන්නෙ, ඊට අනුරූප වූ විඥානය පිහිටන්නෙ නෑ. එහෙම වුනොත්, ස්පර්ශය යන පැනවීම නෑ. මෙන්න මේ ස්පර්ශය නිරෝධයෙන්, කාම නිරෝධයි කියලා කියනවා.

දැන් ඇහැ තියෙනවා. රූපය ඇස් හමුවට එනවා. ඊට අනුරූපව මෙනෙහි කරන්නෙ නැත්නම් අපි කොහොමද මෙනෙහි කරන්නෙ. එහෙනම් ඇහැ පරිහරණය කරන කොට අපි කොහොමද පරිහරණය කරන්නෙ. අන්න ඒ උත්තරය ලැබෙනවා අපිට. කාම නිරෝධ ගාමිණී පටිපදාවෙන්. දැන් කාම නිරෝධය පෙන්නුවා මොකක්ද? ස්පර්ශය නිරෝධයෙන් කාම නිරෝධය වෙනවා. ස්පර්ශ නිරෝධයට පෙන්නුවා. ඇහැ තිබුනත්, රූපය තිබුනත්, ඊට අනුරූපව මෙනෙහි නොකළොත් ඊට අනුරූපව කියන කොට, රූපයට අනුව මෙනෙහි නොකළොත් චක්ඛු විඥානය පිහිටන්නෙ නෑ. එහෙම වුනොත් ස්පර්ශය යන පැනවීම නෑ. ඕක හොඳට පෙන්නනවා මහා හත්ථි පදෝපම සූත්‍රය වගේ සූත්‍රයක. ඊට අනුරූපව මෙනෙහි කිරීම නිසයි විඥානයාගේ පහළ වීම. ඊට අනුරූපව මෙනෙහි නොකළොත් විඥානය පිහිටන්නෙ නෑ කියන එක. ඒකත් බලාගන්න ඕන නම් මජ්ඣිම නිකායෙ මහා හත්ථි පදෝපම සූත්‍රයේ.

ඊට පස්සෙ දැන් 'අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො කාම නිරෝධ ගාමිණී පටිපදා'. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයම කාමය නිරුද්ධ කරන ප්‍රතිපදාවයි. මොකක් ද? දැන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා කියන්නෙ කාමය නිරුද්ධ කරන ප්‍රතිපදාව.

ඒ කියන්නෙ, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගත්තහම සම්මා දිට්ඨි, සමමා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියන අංග අටෙන් සංකප්ප.. සමාධි කියන අංග හත උපදිනවා සම්මා දිට්ඨියට අනුව. සම්මා දිට්ඨිය නිවැරදි දැකීම. සම්මා දිට්ඨිය හරියට තිබුනොත් වෙලා තියෙන්න ඕන මොකක්ද කාමය නිරුද්ධ වෙලා තියෙන්න ඕන. කාම නිරෝධ ගාමිණී පටිපදාව නේ මේ. මේ කාම නිරෝධ ගාමිණී ප්‍රතිපදාව වඩනකොට නිරුද්ධ වෙලා තියෙන්න ඕන. මොකක්ද? කාමය. කාම නිරෝධ ගාමිණී පටිපදාව වඩනකොට කාමය නිරුද්ධ වෙනවා කියන්නෙ කොහොමද? ස්පර්ශයයි නැතිවෙලා තියෙන්නෙ. ස්පර්ශය නැතිවීමෙන් කාමය නැතිවෙනවා. එතකොට ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩනකොට ස්පර්ශය නැතිවෙන්න ඕන. ස්පර්ශය නැතිවෙන විදියටයි වෙන්න ඕන. ඇයි ඒ? ස්පර්ශය නිරෝධයෙන්නෙ කාම නිරුද්ධ වෙන්නෙ. එහෙනම් කාම නිරුද්ධ කරන ප්‍රතිපදාවෙන් ස්පර්ශය තියාගෙන කාමය නිරුද්ධ කරන්න පුළුවන්ද? බෑ.

මේ ප්‍රතිපදාව වඩනකොට නැතිවෙන්න ඕන මොකක්ද? ස්පර්ශය. ස්පර්ශය නැතිවීමෙන් කාමය නැතිවෙනවා. එහෙනම් ස්පර්ශය නැතිවෙන්න නම් අපි කිවුවා ඇහැ තියෙනවා. රූපය තියෙනවා. ඊට අනුරූපව මෙනෙහි කරනවා කියන එක නෑ. එතකොටයි විඥානය පිහිටන්නෙ නැත්තෙ. එතකොටයි ස්පර්ශය නැත්තෙ.

එහෙනම් සම්මා දිට්ඨිය කියන එකෙන් ලැබෙන්නෙ මොකක් ද? ඇහැ තියෙනවා රූපය තියෙනවා ඊට අනුරූපව මෙනෙහි නොකරන්නෙ කොහොම ද කියන එක තමයි සම්මා දිට්ඨියෙන් පෙන්නන්නෙ. තේරෙනවා නේද? ඔන්න ඕකට තමයි මං වෙනදත් කියන්නෙ ඇහැ තියෙනවා. රූපය ඇස් හමුවට එනවා. රූපයට අනුව මෙනෙහි කරන්න එපා. දැන් ඕගොල්ලො මෙනෙහි කරන්න. මෙතන යථා භූත ස්වභාවය. මොකක්ද? මේ පෙනෙන දේ අනිකක්. පවතින දේ අනිකක්. මෙහෙම පෙනුනට පවතින්නෙ මෙහෙම නේද කියලා යථා භූත ස්වභාවය අරමුණු කරන්න. එතකොට ඕගොල්ලන්ට පේන දේට අනුරූප වූ විඥානයක් පිහිටන්නෙ නෑ. පවතින දේට අනුරූප වූ විඥානය පිහිටනවා. එතකොට ස්පර්ශයයි යන ගණයට යන්නෙ නෑ. අර මං කිවුවෙ දැන් ඇහැ තියෙනවා. අපිට වැලි ගොඩක් වගේ පේනවා. දැන් ඇහැත් තියෙනවා. වැලි ගොඩක් දකිනවා කියන තැනකින් අපිට හිත පහල වෙනවා. දැන් අපි කරන්නේ මෙහෙමයි. ඇහැත් නොබිඳුනා. රූපයත් ඇස් හමුවට ආවා. දැන් වැලි ගොඩකුත් පේනවා. පේන දේට අනුව මෙනෙහි කරන්නෙ නෑ. වැලි ගොඩක් බලන්නෙ නෑ. නුවණින් මෙනෙහි කරනවා. මෙහෙම පෙනෙන තැනක තියෙන්නෙ වැලි කැට නේද පෙනෙන දේට ඔබ්බෙන් බලනවා. එතකොට අපිට නුවණ එනවා මොකක්ද පවතින ස්වභාවය වැලි කැට. පෙනෙන්නෙ අපේ මනසට නේද කියන එක එනවා අපිට.

ඇහැ නොබිඳුනා, ජලය වගේ පේන රූපයක් අපේ ඇස් හමුවට ඇවිල්ලා. දැන් අපි පේන දේට අනුව මෙනෙහි කරන්නෙ නෑ. මෙහෙම පෙනන තැනක පවතින්නෙ මිරිඟුව නේද කියලා. මිරිඟුව අරමුනු කරනවා. එතකොට හොඳට පේනවා පවතින්නේ මිරිඟුව. ජලය වගේ පේන්නෙ අපිට නේද. පේන දේ බාහිර තියෙන විදියට හිතන්නෙ නෑ. පේන දේට ඔබ්බෙන් යථාර්ථය හිතුවහම. අද අපිට බාහිරේ වෙලා පෙනෙන දේ අපේ ජීවිතේ වෙන දවසක් තියෙනවා. තිරිසන්ගත සතාට මිරිඟුව දිහා බලනකොට ජලය වගේ පේනවා නම්, තිරිසන්ගත සතාට

බාහිරේ වෙලා පෙනෙනවා නම්, ඒ පේන දේට හිතන්නෙ නැතුව පේන දේට ඔබ්බෙන් හිතපු නිසා, තිරිසන්ගත සතාට පේන මට්ටම අපිට මනස වෙලා පේනවා. නේද? ඒ වගේ. අපි පේන දේට හිතලා මෙහෙම දකින ලෝකයක් තුල, මෙහෙම පෙනෙද්දී පෙනෙන දේට ඔබ්බෙන් අපි බැලුවොත්, අද ලෝකයාට පෙනෙන මට්ටම අපිට අපේ මනස වෙයි. අද අපිට ඇත්ත වෙලා පෙනෙන මට්ටම, අද අපිට බාහිර වෙලා පෙනෙන මට්ටම අපේ මනස වෙන දවසක් එනවා. අන්න එහෙම වුනොත් ඕගොල්ලන්ට බාහිර මෙහෙන් විඳින්න වස්තු කාමයක් හම්බවෙන්නෙ නෑ. වස්තු කාමෙන් මිදෙනවා.

ඒ කියන්නෙ තිරිසන්ගත සතාට වස්තුකාමය කියලා කියන්නෙ වතුර. මිරිඟුව දකිනකොට වතුර පේනවනේ. තිරිසන්ගත සතාට වස්තු කාමය මොකක්ද? වතුර. ක්ලේශ කාමය මොකක් ද? ඒ වතුරට තියෙන තණ්හාව. දැන් එයාට බාහිරින් වස්තුවක් හම්බ නොවුනා නම්, වතුර හම්බනොවුනා නම් තණ්හාව ඇතිවෙයිද? නෑ. ඔන්න එයා වස්තු කාම ක්ලේශ කාමයෙන් යුක්තයි. හරිද. දැන් ඒ අරමුණේදී අපි දකිනවා ඇස් හමුවට ඒ තිරිසන්ගත සතාට පේන අරමුණ ම එනවා. අපි ඒ තිරිසන්ගත සතා දකින විදියට පෙනෙන දේට අනුව හිතන්නේ නෑ. පෙනෙන දේට අනුව, හිතන්නෙ නෑ. අපි හිතනවා පෙනන දේට ඔබ්බෙන් පවතින ඇත්ත. මේ ඇහැ තියෙනවා මේ ඇහැට මෙහෙම පෙනුනට තියෙන්නෙ මිරිඟුව නේද කියලා හිතන කොට තිරිසන්ගත සතාට වස්තු කාමය වෙච්ච බාහිරින් පෙනුන ජලය කියන එක අපිට පේන්නෙ මොන විදියට ද? මිරිඟුව තියෙන තැන ජලය වගේනෙ පේන්නෙ. තිරිසන්ගත සතාට හිතෙන්නෙ පේන දේම බාහිරයි කියලනේ. වස්තු කාමයනෙ ඒ. තිරිසන්ගත සතාට පේන දේ බාහිරයි කියලා වස්තු කාමය කියලා පෙනුන ටික අපිට පේන්නේ කොහොමද? මනස හැටියට නෙමෙයි ද අපිට පේන්නෙ. ඒ කියන්නේ මිරිඟුව නම් පේන දේ. මනසයි කියලයි අපිට පේන්නෙ. තේරුණාද කියන එක. දැන් වස්තු කාමය හැටියට තිරිසන්ගත සතාට හම්බවෙන්නෙ මොකක් ද? වතුර. ඒක කොහෙන්ද හම්බවුනේ. ආධ්‍යාත්මික ද බාහිර ද? බාහිර. ඒකට හේතුව මොකක් ද? වතුරට අනුව මෙනෙහි කෙරුවා මිසක තියෙන්නේ මිරිඟුව යථා ස්වභාවය මෙනෙහි නොකර, පෙනෙන දේට අනුව මෙනෙහි කළ නිසා පෙනෙන දේ බාහිරින් එයාට හම්බවුනා. තේරුණා ද ඊට පස්සෙ ඒ අරබයා තියෙන තණ්හාව වුනා එයාට. මොකක් ද ක්ලේශ කාමය. දැන්

බාහිරෙන් වතුර පෙනෙන බව දකින්න වස්තු කාමය. ඔන්න වස්තු කාමය තියෙන කොට ඒක හිතේ පැත්තෙන් හම්බ වුනොත් වස්තුවක් සැප දුක් විඳින්න බෑ. බාහිරින්මයි එයාට හම්බ වෙන්නෙ. තේරෙනවද? බාහිරෙන් වතුර වලක් එයාට හම්බ වුනානෙ. හම්බවුනා. එතකොට ඒ අරබයා රාගයක් තණ්හාවක් ආශාවක් තියෙනවා නම් මේක කෙලෙසය. දැන් ඒ වස්තු කාම ක්ලේශ කාමය කියන දෙක. දැන් හොඳට බලන්න ඉස්සෙල්ලා වස්තු කාමය හදාගත්තෙත් මෙයාමයි. සංකප්පො කාමො, රාගො කාමො කියලා. මිරිඟුව නිසා ජලය වගේ පෙනුනෙ. මේක ලෝකෙ චිත්‍ර, චිත්‍ර කාමය නෙවෙයි. මිරිඟුව තියෙන තැනක ජලය වගේ ජේනවා කියන එක ධම්තාවයක්. දැන් පෙනෙන දේට අනුව මෙනෙහි කරලා, අනුව හිතලා මෙයා නෙමෙයිද ජලය කියලා එකක් බාහිරින් හදාගත්තෙ. ඔය වස්තු කාමය එයා නෙමෙයිද හදාගත්තෙ. දැන් එයාම හදාගෙන එයාම හදාගත්ත එකට එයාම ඇලිලා නෙමෙයිද? දැන් වස්තු කාමයයි, ක්ලේශ කාමයි දෙකම එයාගෙ සංකල්පයෙන් එයාගෙ රාගය නිසා හැදිලා මිසක, යථාර්ථ වශයෙන් තිබුණ ද?

'තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ'

ලෝකයේ චිත්‍ර එහෙමම තියෙනවා. මිරිඟුව තියෙන තැනක ජලය වගේ ජේනවා. ඒක ධම්තාවය. නමුත් ඒ පෙනෙන දේ ඇති බවට බාහිරේට එයා මෙනෙහි කළොත්, පෙනෙන දේට අනුව මෙනෙහි කළොත්, ඒකයි සංකප්පය. ඒකයි රාගය, ඒකයි එයාගෙ කාමය. එතකොට ලැබෙන්නෙ මොකක් ද? වතුර වලක් හම්බවෙන්නෙ බාහිරින් එයාට. ඔන්න දැන් එයා වස්තු කාමයත් හදාගෙන. ක්ලේශ කාමයත් එයා හදාගෙන නෙමෙයිද ඉන්නෙ.

පිළිගන්නවද තිරිසන්ගත සතාට වස්තු කාමය කියන එක ජේන වතුර, බාහිර තියෙන කියන එක, ඒ නිසා ඇති තණ්හාව ආසාව රාගය කියන එක ක්ලේශ කාමය. මෙයාගෙ වස්තු කාමයයි. ක්ලේශ කාමයයි දෙකම බාහිර තිබුන වස්තු කාමය වුනා නම් අපිටත් ඒක වෙන්න ඕන. නමුත් අපිට වස්තු කාමය නොවී එයාට විතරක් ඒක වස්තු කාමය වුනා නම් ඒක එයා හදාගත්ත එකක් නේ. ඒ වගේ ම දකින්න මේ අපිත් එහෙමයි. එතකොට ඒ තිරිසන්ගත සතා ඇහැ නොබිඳුනා. ඇස් හමුවට රූපයක් ආවා. ඊට අනුරූපව මෙනෙහි කළ නිසයි වස්තු කාමය හැදුනෙ. ඒ නිසයි ක්ලේශ කාමය හැදුනෙ. අපිටත් ඒ වගේ ම ඇහැ නොබිඳුනා, ඇස් හමුවට රූප ආවා අපි ඊට අනුව මෙනෙහි කරන්නේ

නැතුව යථා ස්වභාවය මෙනෙහි කළා. පෙනෙන දේට අනුව මෙනෙහි කළේ නෑ. අපි මෙනෙහි කළේ මිරිඟුව. යථා ස්වභාවය. ඒකෙන් වුනා මොකක්ද? අරයට වස්තු කාමය වෙච්ච මට්ටම අපිට මනස වුනා. වස්තු කාමයෙන් මිදුනා නම්, ක්ලේශ කාමය කෙලින්ම අතහැරෙනවා. මොකද වස්තුවකුත් නැත්නම් කෙලේසය කියන එකට පතිත වෙන්න තැනක් නෑ. තේරුණාද කියපු එක. ඒ වගේ දැන් මේ අරමුණෝදිත් මිරිඟුව කියන තැනක ජලය තියෙනවා වගේ සතර මහා ධාතුව තියෙන තැනක මෙහෙම සංඥාවක් අපට පෙනෙද්දී, අපි ජේන දේට අනුව මෙනෙහි කළොත් මේ ජේන දේ බාහිරේ වෙලා රූපායතනය වෙලා අපිට හම්බවෙනවා කාමය හැටියට. ඊට පස්සෙ ඔන්න ඒකට අපි කැමැත්ත ඇති කර ගන්නවා. දැන් වස්තුකාම, ක්ලේශ කාම දෙක හදාගෙන අපි මේ ඉන්නෙ.

ඇහැ තියෙනවා නොබිඳෙනවා රූපය ඇස් හමුවට එනවා. ඊට අනුව මෙනෙහි කරන්නෙ නැතුව, අපි යථා ස්වභාවය මෙනෙහි කළොත්, මොකද වෙන්නෙ මේ වස්තු කාම ක්ලේශ කාමය කියන දෙකෙන් මිදෙනවා. ඒ කියන්නෙ අද අපිට බාහිරෙන් හම්බවෙන වටපිටාව අපේ මනස වෙන දවසක් එනවා. දැන් තිරිසන් ගත සතාට හම්බවෙන වස්තුකාම ක්ලේශ කාමය දෙකම එයාගෙ මනසින් හදාගත් එකක්. එතන තියෙන ඇත්ත මේකයි කියලා අපට ජේනවනේ. ඒ වගේ අද අපිට මේ වස්තු කාමය ක්ලේශ කාම වෙච්ච දෙකම අපි හදාගත්ත එකක් මෙතන පවතින ඇත්ත මේකයි කියලා බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලාට ජේනවා. නමුත් අපිට ජේන්නේ නෑ. අපිට ජේන්නෙ මොකක් ද? මේ දුවා, පුතා, ගෙවල් දොරවල් මයි. මිරිඟුව නෙමෙයි අපට ජේන්නෙ. ජලය මේ. මිරිඟුව තියෙන තැනක ජලය ජේනවා වගේ ධාතුව තියෙන තැනක මෙහෙම සටහනක් අපට ජේනවා. දැන් ජේන දේට අනුව හිතනවා කියලා කියන්නෙ අපි මොකක්ද? මේ වස්තු කාමය නිර්මාණය වෙන විදියට ඉන්නවා. මේ කාමය කියන එක සංකප්පො කාමො රාගො. සංකප්ප රාගො කාමො කියලා කිවුවෙ. මෙන්න මේ කාමය උපදවාගෙන කාමයෙන් සැප දුක් විඳින මට්ටම. කාමයෙන් සැපදුක් විඳින එක තමයි අපේ කෙලේසය. ඒකට ඉස්සෙල්ලා මෙ කාමය අපි උපදවාගෙන තියෙන්නෙ. ඒ කියන්නෙ අවිද්‍යාව ඇතුලෙ. එතකොට ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා කිවුවෙ කාම නිරෝධ ගාමිණී පටිපදා කියලා කියන්නෙ ඇහැ තියෙනවා රූපය ඇස් හමුවට

එනවා. ඊට අනුව මෙනෙහි කරන්නෙ නෑ. ඒ කියන්නේ ඇහැ තියෙනවා. රූපය ඇස් හමුවට එනවා. මිරිඟුව දිහා බලනකොට තිරිසන්ගත සතාට වගේම අපිටත් එකම විදියටයි ඇහැ. ඒ සතාට වගේම එකම විදියටයි අපිටත් පේන්නෙ. ඒ සතා පේන දේට අනුව මෙනෙහි කරනවා. අපි පේන දේට අනුව මෙනෙහි කරන්නෙ නෑ. අපි යථා ස්වභාවය මෙනෙහි කරනවා. ඒ නිසා ඒ සතාගෙ මට්ටමින් අපි මිදිලා ඉන්නවා. ඒ වගේ දැන් ඇහැත් තියෙනවා. රූප ඇස් හමුවට එනවා. ලෝකෙ හැමෝම පෙනෙන දේට අනුව මෙනෙහි කරනවා. අර තිරිසන්ගත සත්තු මිරිඟුවේ මෙනෙහි කරනවා වගේ. අපි මිරිඟුවේ දී මනුෂ්‍යයො මෙනෙහි කළා වගේ මේ අරමුණේදි පෙනෙන දේට අනුව මෙනෙහි නොකර ඊට ඔබ්බෙන් මෙනෙහි කළොත් මේ ලෝකයාගෙ, කාමයෙ ඉන්න කෙනාගෙ මට්ටමින් අපි මිදිලා. කාමයෙන් මිදෙන්න පුළුවන්, එතකොට එයා දන්නවා 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියනකොට වස්තුකාම ක්ලේශ කාම කියන එක දන්නවා. අද අපිට බාහිරින් මෙන්න මෙහෙම හම්බ වෙන එක වස්තුකාමය. ඒ අරබයා ඇති තණ්හාව ක්ලේශ කාමය. මේ දෙකේම ස්වභාවය තමයි, කාමය ඇටසැකිල්ලක්, තණ සුළක්, ගිනි අඟුරු වලක් මෙන්න මෙබඳු ස්වභාවයයි කාමය කියන එක. ඒ කාමය ද නිකම් නෙමෙයි ස්පර්ශය නිසයි කාමය ඇතිවෙලා තියෙන්නෙ. හොඳට බලන්න. ඵස්ස සමුදයො - කාම සමුදයො කියනකොට හොඳට පෙන්නනවා. කාමය කියන එක ස්පර්ශයකින් හදාගත්ත එකක්. දැන් අද අපි දන්නෙ, අපිට ස්පර්ශ වුනත් නැතත් මේ හැදිච්ච ගස් කොළන් තියෙනවා. අපිට ස්පර්ශ වුනත් නැතත් ගෙවල් දොරවල්, යාන වාහන, ඉස්පිරිතාල තියෙනවා කියලනෙ අපි හිතාගෙන ඉන්නෙ. නමුත් ස්පර්ශය කියන එක කොහේද තියෙන්නෙ. මනසෙ නම්, ස්පර්ශ සමුදයෙන් නම් කාම සමුදය. කාමය කියන එක ස්පර්ශය නිසා නම් ඇතිවුනේ, මනසෙන්ම හදාගත්ත ධර්මයක් කියන එක පෙන්නනවා නේද බුදුරජාණන් වහන්සේ. ආයෙ බුදුරජාණන් වහන්සේ බොරු එහෙම කියනවද? මොකද මෙහේ කාම භාණ්ඩ කාමය තියෙද්දිත් ස්පර්ශය තියෙනවා කිවුවම, අපි ඔතෙන්දි හිතන්නෙ ස්පර්ශය නිසා කාමය කියනකොට. ගහ මෙහේ තියෙනවා ඒකට තියෙන කැමැත්තයි මේ ස්පර්ශය නිසා කියන තැනින්. ඒක නෙමෙයි කාමය. වස්තු කාමය ක්ලේශ කාමය කියන දෙකම කාමය. වස්තු කාමයත් අයිතියි. ක්ලේශ කාමයත් අයිතියි. දෙකම ස්පර්ශය නිසා. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත් , ලෝක නිරෝධ ගාමිනී

පටිපදාවත් මේ බඹයක් පමණ ශරීරයෙන් පනවමි. එහෙනම් කාම ලෝකය කොහෙන්ද දකින්න වෙන්නෙ. මෙහෙන් දකින්න වෙන්නෙ. කාම ලෝකයෙ ඇතිවීමත් මෙහෙන් දකින්න වෙන්නෙ. කාම ලෝකයෙ නැතිවීමත් මෙහෙන් දකින්න වෙන්නෙ. කාම ලෝකෙ නැති තැනත් මෙහෙන් තමයි දකින්න වෙන්නෙ.

ඒ නිසා හොඳට දකින්න 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියනකොට වස්තු කාම, ක්ලේශ කාම දෙකත් දකින්න. ඒ වස්තු කාම, ක්ලේශ කාම දෙක හිතෙශි කෙනෙක් නෙමෙයි. සප්පසිරූපමා කාමා. කාමයට කියනවා සර්ප හිසක් වගෙයි කියලා. ආයෙ දෂ්ට කළොත්, ඇල්ලුවොත් මොකද වෙන්නෙ. කෙලින් ම මරණය හෝ මරණය සමාන දුකට පත්වෙනවා. තව තියෙනවා. ඔය ටිකක් වෙලා කිවුවොත් මතක් වේවි. බොහෝ ජාති කියනවා බුදුරජාණන් වහන්සේ මේ කාමය ගැන. ආදීනව ගැන. මෙහෙම මෙහෙම දකින්න කියලා. අන්න එබඳුයි කාමය. 'කාමා භික්ඛවෙ වේදිතබ්බා' කියන කොට ඒ විදියට දකින්න ඕනෙ. ස්පර්ශය සමුදයෙන් කාම සමුදය දකින්න. ඊට පස්සෙ කාමයන්ගෙ නානත්වය රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්ගේ නානත්වයෙන් දකින්න. කාමයාගේ විපාකය දකින්න මොකක් ද ක්‍රෝධ භක්ෂ යක්ෂයා වගේ. මෙහෙ කැමති වෙන්න කැමති වෙන්න මෙහෙ පුද්ගලයා නිර්මාණය වෙන ගතිය. මෙහෙ පුද්ගලයා නිර්මාණය වුනොත් කුසල හෝ අකුසල රැස්වෙලා මරණින් මත්තෙත් පුද්ගලයගෙ ප්‍රතිසන්ධිය හිස් නැති බවින් දකින්න.

ඊට පස්සෙ ස්පර්ශ නිරෝධයෙන් කාම නිරෝධ වෙනවා කියලා දකින්න. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අනුව ජීවත් වුනොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය, කිවුවෙ සම්මා දිට්ඨි, සම්මා දිට්ඨි කිවුවෙ දකින දේ ඇත්ත දකින්න. මිරිඟුවේ පෙනෙනවා කියන දේ ඇත්ත දකින්න. මිරිඟුවක් තියෙන තැනක, අපිට යම් වස්තුවක් පෙනෙනවා කියන තැනක තියෙන ඇත්ත දකින්න. මිරිඟුව තියෙන තැනක මෙහෙම පේනවා. එච්චරයි. සම්මා දිට්ඨි කියන කොට ඕගොල්ලො වෙන මුකුත් අමුතුවෙන් හිතන්න ඕන නෑ. ඇත්තටම ඇත්ත දකින්න. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතුව තියෙන තැනක මෙහෙම පේනවා. නැත්නම් කන බොන ආහාරයෙන් හැදුන රූපයක් තියෙන තැනක මෙහෙම පේනවා. මෙහෙම පෙනුනට පේන දේ කන බොන ආහාරය ද, ආහාරයෙන් හැදුන දේ ද, අත නිසා හෙවනැල්ලක් වැටුනට

අත කියන්නෙ හෙවනැල්ල ද? ඒකට සම්බන්ධයක් නෑ. ඒ වගේ පවතින දේ සහ පෙනෙන දේ කියන මේ ධර්මතා දෙක වෙන්වෙන විදියට නුවණ ගෙනියන්න. පෙනෙන දේට අනුව මෙනෙහි කරන්න එපා. එහෙම වුනොත් සම්මා දිට්ඨිය තමයි, මෙහෙම පෙනුනට පවතින දේයි අරමුණු කරන්නෙ. පේන දේට අනුව අරමුණු කරන්නෙ නෑ. එහෙම කෙරුවහම වෙලා තියෙන්නෙ මොකක්ද ස්පර්ශය වෙලා නෑ. ස්පර්ශය නිරුද්ධ වෙලා ස්පර්ශය නිරුද්ධ වුනොත් කාමය නිරුද්ධ වෙලා. එහෙම වුනොත් වෙලා තියෙන්නෙ මොකක්ද. මේ කාමයෙන් අපි මිදිලා. කාමයෙන් මිදෙනවා. ඒ විදියට කෙනෙක් ඉගෙන ගෙන භාවිතා කළොත් ඒකාන්තයෙන්ම මේ කාම නිරෝධ කරලා මේ ජරා මරණ දුකෙන් මිදෙන්න පුළුවන්.

ඒ සඳහා මේ දේශනාව හේතු උපනිශ්‍රයම වේවා!

සාදු! සාදු !! සාදු !!!

ධර්ම දානයකි. නොමිලයේ බෙදා දීම පිණිසයි.

පොත පිළිබඳ විමසීම් :- 077 7 665 198

Nethwin Printers, Peradeniya - 081 2 385 837